ISSN 2357-2973

# ජාතික පුස්තකාල විමර්ශන
# தேசிய நூலக நோக்கு
# NATIONAL LIBRARY REVIEW

වෙළුම-01, කලාපය 02 ජූලි-දෙසැම්බර් 2014
தொகுதி 01, இலக்கம் 02 ஜுலை-டிசம்பர் 2014
Vol. 01, No. 02, July-December2014



ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபை
National Library and Documentation Services Board

# NATIONAL LIBRARY REVIEW

# ජාතික පුස්තකාල විමර්ශන

# தேசிய நூலக நோக்கு

# NATIONAL LIBRARY REVIEW


වෙළුම 01, කලාපය 02 ජූලි - දෙසැම්බර් 2014

தொகுதி 01, இலக்கம் 02 ஜனவரி – ஜூன் 2014

**Vol. 01, No 02 July – December 2014**



ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

**தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபை**

**National Library and Documentation Services Board**

# NATIONAL LIBRARY REVIEW

**Vol. 01, No: 02**
**July – December 2014**

**ISSN 2357 – 2973**

**Advisory Committee**

Prof. Somarathna Balasooriya
Prof. Piyadasa Ranasingha
Dr. Premila Gamage
Dushyanthi Daniel

**Editors**

W. Sunil
G. D. Amarasiri

**Assistant Editors**

Priyanga Bandara
Kamalangani Subasinghe

**Computer Type Setting**

Asoka Damayanthi

**Publisher**

Library Research Division
National Library and Documentation Services Board
No. 14, Independence Avenue
Colombo 07.
SRI LANKA

Telephone : 011- 3056388
Fax : 011- 2685201
E- mail : research@mail.natlib.lk
Web site : www.natlib.lk

***Authors are responsible for the content of their articles published in this journal***

## Editors' note

Information has become an essential component of modern information society. Information is extreamly important for every aspect of human society such as education, communication, management, business, technology, etc.. Library and Information Science is directly involved in information management. Library and Information Science is the only subject which wildely discusses information management. In modern information society, knowledge creation is an important requirement. For knowledge creation, extensive research is necessary in any subject field. Publication of scholarly Journals are very important for the dissemination of new knowledge generated through research. ''National Library Review'' is a result of an effort made by Nationl Library and Documentation Services Board to disseminate new knowledge of Library and Information Science to the Sri Lankan library community.

A scholarly journal of this nature is a long felt need of the library community in Sri Lanka. Library and Information Science is becoming an increasingly popular subject and the number of students who follow Library and Information Science has increased considerably during the last few years. Therefore, the literature on Library and Information Science should be developed to meet the increasing demand.

We are exteamly thankful to all the authors who provided articles for this journal and prof. Piyadasa Ranasinghe, Dr. Premila Gamage and Mrs. Dushyanthi Daniel of the National Library Review editorial commitee and examing the final manuscript of the journal. We also thankful to all the reviewers of the articles for their contribution.

# Contents


**ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ හෙට දවස** 1

උපාලි අමරසිරි

**ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ප්‍රතිපත්තිය සහ පාසල් පුස්තකාල සේවාව** 22

එච්. එම්. ගුණරත්න බණ්ඩා

**Digitization : Panacea for Preservation And Access in Libraries and Archives?** 47

**Dr. K. D. G. Wimalaratne**

**ශ්‍රී ලංකාවේ ඵලදායී මහජන පුස්තකාල සේවාවක් සඳහා මහජන පුස්තකාල ව්‍යවස්ථා හඳුන්වාදීමේ වැදගත්කම** 56

ජී. ඩී. අමරසිරි

**National Library Services in the Twenty First Century : Challenges and Opportunities** 70

**L. A. Jayathissa**

**වර්ගීකරණයේ ඉතිහාසය සැකෙවින් හා විවිධ දැනුම වර්ගීකරණ ක්‍රම කිහිපයක් පිළිබඳ සංක්ෂිප්ත ඇගයීමක්** 90

විජය ප්‍රේමදර්ශන

**National Social Media Regulations for Information Service Providers** 111

**Dr. Ruwan Gamage**

**யாழ்ப்பாணப்பல்கலைக்கழக சமுக விஞ்ஞானத்துறைசார் பட்டதாரி மாணவர்களின் நூலகப்பயன்பாடு–ஓர் ஆய்வு** **119**

*நவநீதகிருஷ்ணன், சு மகிரன், சு*

**Guidelines for contributors** 141

# ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ හෙට දවස

## උපාලි අමරසිරි

**සාරාංශය**

*ශ්‍රී ලංකාවේ ජාතික පුස්තකාල සේවාවේ කේන්ද්‍රස්ථානය ලෙස සැලකෙනුයේ ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය වේ. 1990 වසරේ පිහිටවූ මෙම ජාතික ආයතනය 2015 වසරේ සිය රිදී ජුබිලිය සමරනු ලබයි. තොරතුරු හා සන්නිවේදන ක්ෂේත්‍රයේ අතිවිශාල වර්ධනයන් මෙන්ම ජාතික හා අන්තර්ජාතික සුවිශේෂ තත්වයන් යටතේ ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය ඉදිරි කාලයේ මුහුණ දෙන ඇතැම් අභියෝග පිළිබඳව මෙන්ම මෙම අභියෝග ජය ගැනීම සඳහා ගතහැකි පියවර පිළිබඳව කතුවරයා මෙම ලිපියෙන් සාකච්ඡා කරනු ලබයි.*

**මූලික පද**

*ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය, ජාතික පුස්තකාල සේවා, ජාතික පුස්තකාල සේවා නවීකරණය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ බලපෑම, ප්‍රශස්ත කළමනාකරණය*

## ජාතික පුස්තකාල කාර්යයන්

ජාතික පුස්තකාල කාර්යයන් පිළිබඳ ව විවිධ විද්වතුන් පුළුල් ලෙස සාකච්ඡා කර ඇත. ලොව විවිධ ජාතික පුස්තකාලවල කාර්යයන් ඇතැම් විට එකිනෙකට වෙනස් වුවත්, පොදුවේ බහුතරයක් ජාතික පුස්තකාල අනුගමනය කරනු ලබන, පිළිගත් ජාතික පුස්තකාල කාර්යයන් ගණනාවක් ඇත.

- ප්‍රධාන වශයෙන් නීතිමය තැන්පතු නීතිය මගින් සහ වෙනත් මාර්ගවලින් ජාතියේ අත්පිටපත්, මුද්‍රිත, ශ්‍රව්‍ය-දෘශ්‍ය හා විද්‍යුත් ප්‍රකාශන එක් රැස් කිරීම
- ජාතික එකතුව විධිමත්ව සංවිධානය කිරීම සහ සංරක්ෂණය
- ජාතික ග්‍රන්ථ විඥාපන පාලනය
- විමර්ශන හා පාඨක සේවා සැපයීම
- ජාතික මට්ටමේ පුස්තකාල ක්ෂේත්‍රයේ නායකත්වය
- කියවීම, තොරතුරු සාක්ෂරතාව, ග්‍රන්ථ සංවර්ධන වැනි ජාතික වැඩසටහන් මෙහෙයවීම

ප්‍රතිසංවිධානය කොට විද්වත් උපදේශක කමිටුවක අධීක්ෂණය යටතේ ප්‍රවර්තන, පූර්වකාලීන හා විශේෂ ග්‍රන්ථනාමාවලී සම්පාදනයේ දැවැන්ත මෙහෙවරක් සාර්ථකව ඉටු කරන ලදී. විද්වත් සමුළු, ජාතික පුවත්පත්, රජයේ ප්‍රකාශන, දේශීය පුස්කොළ පොත්, පශ්චාත් උපාධි නිබන්ධන සහ ජනවාර්ගික ගැටලුව වැනි විශේෂ ක්ෂේත්‍ර ගණනාවක ග්‍රන්ථ විඥාපන සේවා ඉටු කිරීම සඳහා ප්‍රලේඛන සේවා අංශය නමින් වෙනම අංශයක් ඇති කොට පුළුල් ග්‍රන්ථ විඥාපන හා ප්‍රලේඛන සේවාවක් දියත් කරන ලදී. පාඨක සේවා, තොරතුරු තාක්ෂණ, සංරක්ෂණ වැනි ජාතික පුස්තකාලයට ඍජුව සම්බන්ධ අංශ ද, පුස්තකාල සංවර්ධන, අධ්‍යාපන හා ප්‍රකාශන වැනි ජාතික පුස්තකාල සේවා අංශ ද නව ආයතනයට ශක්තිමත් පදනමක් ලබා දීමට විශාල වශයෙන් දායක විය. ජාතික පුස්තකාලය නිල වශයෙන් ඇරඹීමට පෙර, ජාතික ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය වැනි ඇතැම් ජාතික පුස්තකාල කාර්යයන් ඇරඹී තිබීමත්, ජාතික මට්ටමේ පුස්තකාල සංවර්ධන ව්‍යාපෘති සැලකිය යුතු ප්‍රගතියක් ලබා තිබීමත්, මෙම කටයුතුවල සාර්ථකත්වයට ආධාර විය. වසර කිහිපයක ප්‍රයත්නයකින් අනතුරුව 1998 වසරේ දී එවකට වසර 28 ක් පැරණි, ආයතනයට අදාළ පනත සංශෝධනය කොට ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ වගකීම හා කාර්යභාරය පැහැදිලිව දැක්වෙන නව පාර්ලිමේන්තු පනතක් හඳුන්වා දෙන ලදී. සමස්තයක් ලෙස ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ ආකෘතිය හා කාර්යයන් මුල් දශකයේ හඳුන්වාදුන් ව්‍යුහයට අනුකූලව තවමත් ක්‍රියාත්මක වේ. ඇතැම් ව්‍යාපෘති ඉවත් වීමත්, නව ව්‍යාපෘති ගණනාවක් හඳුන්වාදීමත් මේ අතර දැකිය හැකිය.

## සුවිශේෂ අභියෝග

ඉදිරි දශකය තුළ (2015-2025) ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ සාර්ථකත්වය, එය වර්තමාන සුවිශේෂ අභියෝගවලට මුහුණදෙන ආකාරයෙන් තීරණය වනු ඇත. වසර කිහිපයක තරමක වියවුල් සහගත කාලය නිමාකොට යහපත් වෘත්තීය නායකත්වයක් ආයතනයට ලැබීම දැනට ඇති විශාල වාසිසහගත තත්ත්වයකි. නව දේශපාලන නායකත්වය, පළපුරුදු ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය හා උද්යෝගීමත් සෙසු කාර්ය මණ්ඩලය ආයතනයේ ඉදිරි කටයුතුවලට ප්‍රබල සහායක් වනු ඇත.

ජාතික ග්‍රන්ථ විඥාපන පාලනය සඳහා ජාතික පුස්තකාලය හෝ එම කාර්යයෙහි නියැලෙන අදාළ ආයතනය වෙත ලබාදීම වේ. ශ්‍රී ලංකාවේ නීතිමය තැන්පතු නීති, 19 වන සියවසේ හා 20 වන සියවසේ මුල් දශකයේ ඒවා පැනවුණු මුල් ස්වරූපයෙන්ම, කාලීන අවශ්‍යතා අනුව සංශෝධනය නොවී පැවතීම නිසා සහ නීතිය ක්‍රියාත්මක කරලීමේ ඇති දුබලතා නිසා අදාළ අරමුණු මුදුන්පත් කර ගැනීමට අපොහොසත් වී ඇත. පසුගිය දශකය තුළ සීඝ්‍රයෙන් ව්‍යාප්ත වන විද්‍යුත් ප්‍රකාශන සහ ශ්‍රව්‍ය දෘශ්‍ය ප්‍රකාශන දේශීය නීතියෙන් ආවරණය නොවන අතර මුද්‍රිත ප්‍රකාශන ආවරණය ද ඒ සඳහා යොදා ඇති ක්‍රමවේදය ද වෙනත් රටවල් සමඟ සැසඳීමේ දී අතිශය දුර්වල තත්වයක පවතී. එම නීතිය ක්‍රියාත්මක කරනු ලබන ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව 2015 වසරේ දී එය විධිමත් පරිදි සංශෝධනය කිරීමට අපේක්ෂා කරන බව දන්වා ඇත. එය ඉටු නොවුණහොත් යෝජිත ජාතික පුස්තකාල ව්‍යවස්ථා සංශෝධනයේ දී මෙම නීතිය ක්‍රියාත්මක කිරීම සහ සංශෝධනය කිරීම එහි නියම හිමිකරුවන ජාතික පුස්තකාලයට පවරාගත යුතු වේ. ශ්‍රී ලංකාවේ නීතිමය තැන්පතු නීතිය සංශෝධනය දැනටමත් අඩසියවසක් පමණ ප්‍රමාද වී ඇති ප්‍රමුඛ ජාතික අවශ්‍යතාවකි.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය ඒ මගින් ඉටු කෙරන ජාතික කාර්ය භාරයට ගැලපෙන, සමාන සංස්කෘතික ආයතන සමඟ සමීප සබඳතා පවත්වා ගැනීම පහසු කෙරෙන, ගැලපෙන අමාත්‍යාංශයකට අනුබද්ධ කරලීම තවත් වැදගත් ජාතික අවශ්‍යතාවකි. ජාතික පුස්තකාලයක ප්‍රධාන වගකීම ජාතියේ බුද්ධිමය උරුමයට අදාළ අත්පිටපත්, මුද්‍රිත ලේඛන, ශ්‍රව්‍ය - දෘශ්‍ය මාධ්‍ය, විද්‍යුත් ලේඛන ආදිය එක් රැස් කිරීම, ඒවායේ ග්‍රන්ථ විඥාපන පාලනය, පාඨක සේවා සහ මෙම ජාතික උරුමය අනාගත පරපුර සඳහා ආරක්ෂා කර ගැනීම වේ. ශ්‍රී ලංකාවේ මේ හා සමාන සංස්කෘතික හා බුද්ධිමය උරුමයන් ආරක්ෂා කරනු ලබන අනෙකුත් සංස්කෘතික ආයතන අතර ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වැනි ආයතන ප්‍රධාන වේ. එබැවින් ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය ද මෙම ජාතික සංස්කෘතික උරුමයන් ආරක්ෂා කරනු ලබන ආයතන පද්ධතියට එක් වී, එම ආයතන සමග එක් අමාත්‍යාංශයකට සම්බන්ධවීම අත්‍යවශ්‍ය වේ. දැනට පවත්නා ආකාරයට එය අධ්‍යාපන අමාත්‍යාංශය වැනි සංස්කෘතික ක්ෂේත්‍රයෙන්

ලේඛනාගාරය, ජාතික කෞතුකාගාරය වැනි රටක සියලුම සංස්කෘතික ආයතනවල ඇති සම්පත් සංඛ්‍යාංකකරණය මගින් පොදු ඩිජිටල් දැනුම් ගබඩා හෝ පුළුල් ජාතික ඩිජිටල් පුස්තකාලයක් ලෙස වර්ධනය වීමේ නව ප්‍රවණතාවක් අන්තර්ජාතිකව ඇති බව ද අප අමතක නො කළ යුතුය. සංස්කෘතික භාණ්ඩවල භෞතික ස්වරූපය පුස්කොළ පොත්, මුද්‍රිත පොත්පත්, රාජ්‍ය ලේඛන, සෙල්ලිපි, කෞතුක භාණ්ඩ, පුරාවස්තු, සිතියම්, චිත්‍ර වැනි කුමන ස්වරූපයක් ගනු ලැබුව ද ඒ සියල්ල පොදු ජාතික එකතුවක් ලෙස ඩිජිටල් මාධ්‍යයෙන් ඉදිරිපත් කරලීමේ හැකියාව නව තාක්ෂණය නිසා ලැබී ඇත. එබැවින් මෙම සියලුම සංස්කෘතික ආයතන එක් අමාත්‍යාංශයක් යටතේ සංවිධානය වීම හා කටයුතු කිරීම මෙම අනාගත ව්‍යාපෘති සාර්ථක කර ගැනීම සඳහා ද වැදගත් වේ.

## ජාතික පුස්තකාල සේවා නවීකරණය හා පුළුල් කිරීම

පසුගිය වසර 25 තුළ ශ්‍රී ලංකාවේ ජාතික පුස්තකාල සේවා සඳහා ශක්තිමත් පදනමක් වැටී ඇත. එය නව ජාතික පුස්තකාලයක් ලෙස ආඩම්බර විය හැකි කරුණකි. පාඨක සේවා, ග්‍රන්ථ විඥාපන පාලන සේවා, ප්‍රතිග්‍රහණ කටයුතු ඇතුළු ජාතික පුස්තකාලයේ සෑම අංශයක් ම පාහේ යහපත් ලෙස වර්ධනය වී ඇත. එසේ වුව ද පසුගිය දශකය තුළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ සිදු වූ හා දැනටත් සිදුවෙමින් පවතින සුවිශාල වර්ධනයන් හේතුවෙන් ලොව සියලුම ජාතික පුස්තකාලවලට තම කටයුතු ශීඝ්‍රයෙන් නවීකරණය කරලීමට සිදුව ඇත. ඒ අනුව ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය ද සිය කටයුතු නවීකරණය සඳහා සැලසුම් සහගත වැඩපිළිවෙළක් දියත් කළ යුතු වේ. ජාතියේ විද්‍යුත් ප්‍රකාශන රැස් කිරීම, ජාතික එකතුවේ ඇති දුර්ලභ සහ විශේෂ එකතු සංඛ්‍යාංකකරණය (digitization), වෙනත් ආයතනවල තැන්පත්ව ඇති විශේෂ ජාතික එකතු සංඛ්‍යාංකකරණය කොට එම පිටපත් ජාතික පුස්තකාලයට ලබාගෙන අංග සම්පූර්ණ ජාතික එකතුවක් ගොඩ නැගීමට ප්‍රයත්න දැරීම, සංඛ්‍යාංකකරණය කරන ලද ජාතික එකතුව (සුවිශේෂ කොටස් හැර) ජාතික පුස්තකාල වෙබ් අඩවිය ඔස්සේ අන්තර්ජාලයට සම්බන්ධ කොට ලොව ඕනෑම ස්ථානයක සිට එම සම්පත් පරිහරණයට පහසුකම් සලසා දීම මෙම නවීකරණ ක්‍රියාවලියේ ප්‍රමුඛ කටයුතු වේ.

වෙබ් හා මාර්ගගත (online) සේවා ලෙස ලබා දෙමින් සිටී. මෙම තත්වය ඉදිරි වසර කිහිපය තුළ පෘථුල ලෙස ව්‍යාප්ත වනු ඇත. ඒ අනුව තොරතුරු ක්ෂේත්‍රයේ ප්‍රමුඛ ජාතික ආයතනය ලෙස ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය ද තම කටයුතු හා සේවා නවීකරණය කරලීම අත්‍යවශ්‍ය වේ. ජාතික පුස්තකාලයේ සම්පත්, සේවා, විශේෂ වැඩසටහන්, කාර්යමණ්ඩල තොරතුරු, ද්වීතීයික මූලාශ්‍ර ආදිය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය තුළින් දැනටමත් ලබාගත හැක. මෙය තවදුරටත් වර්ධනය කොට තනිවම හෝ වෙනත් ප්‍රධාන ආයතන හා පුස්තකාල සමඟ එකතු වී අන්තර් ජාතික විද්‍යුත් වාර සඟරා පාඨකයින්ට සැපයීම, ලොව ප්‍රමුඛ පෙළේ දැනුම් සම්පත් අන්තර්ජාලය ඔස්සේ ලබාදීම, දුරස්ථ පාඨක සේවා, සමාජ මාධ්‍ය ඔස්සේ නිරතුරුව පාඨකයින් සමග සංවාදය වැනි සුවිශේෂ ආකර්ශණීය සේවා ජාතික පුස්තකාලයේ ඉලක්කය විය යුතු වේ.

## නව පාඨක අවශ්‍යතා

ජාතික පුස්තකාලය නව තාක්ෂණය වැළඳ ගැනීම මෙන්ම නව තාක්ෂණය ජාතික පුස්තකාලයේ පාඨකයින්ට හා පොදුවේ සමාජයට සිදු කර ඇති සහ සිදු කෙරෙමින් පවතින අතිවිශාල බලපෑමද එය නිවැරදිව අවබෝධ කරගත යුතු වේ. ගූගල් පරම්පරාව (Google generation) ලෙස හඳුන්වන, නවීන ජංගම දුරකථන, ටැබ්ලට්, සහ විවිධ මාදිලිවල පරිගණක භාවිත කරන මෙම පරපුර සඳහා තව දුරටත් සාම්ප්‍රදායික පුස්තකාල සේවා පමණක් අදාළ නොවේ. ඔවුන් පැරණි පරපුරට වඩා තොරතුරු සොයායන අතර එම තොරතුරු තම ජංගම දුරකථන, පරිගණක, ටැබ්ලට් පරිගණක ඔස්සේ නිවසේ, කාර්යාලයේ හෝ ඔවුන් සිටින ඕනෑම තැනක සිට ලබා ගැනීමට මහත් ප්‍රියමනාපයක් දක්වයි. බටහිර සහ වෙනත් තාක්ෂණික දියුණු රටවල මෙන් අප රටේ මෙම නව පරපුර තවම පැහැදිලිව ඉදිරියට නො පැමිණිය ද, එය ඉදිරි කාලයේ ක්‍රමයෙන් වර්ධනය වන බවට සැකයක් නැත. ශ්‍රී ලංකාවේ ජනගහනයට වඩා පවතින ජංගම දුරකථන ප්‍රමාණය අධික බව ද, විදුලි සන්දේශ ජාලය නවීකරණය වෙමින් රට පුරා වේගයෙන් ව්‍යාප්ත වන බව ද, තොරතුරු තාක්ෂණ සාක්ෂරතාවය දකුණු ආසියා කලාපයේ වේගයෙන් ම වර්ධනය වන රට ශ්‍රී ලංකාව බව ද සලකන විට නව තාක්ෂණය වැළඳගත් නව පරපුරේ ප්‍රබල ආගමනය වැඩි ඈතක නොවන බව පෙනේ. 2015 ජනාධිපතිවරණයේදී සමාජ මාධ්‍ය

තොරතුරු තාක්ෂණ විශේෂඥයන්ගේ සේවය විශේෂ ව්‍යාපෘති සඳහා ලබා ගැනීම, ජාතික පුස්තකාල කාර්ය මණ්ඩලයට තම තොරතුරු තාක්ෂණ දැනුම වර්ධනයට හා යාවත්කාලීන කර ගැනීමට පහසුකම් සැලසීම, දේශීය/විදේශීය විශේෂ ව්‍යාපෘති මගින් ජාතික එකතු සංඛ්‍යාංකකරණය ඇතුලු ප්‍රධාන ව්‍යාපෘති සඳහා අවශ්‍ය සම්පත් සපයා ගැනීම, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය (ICTA) සමග සමීප සහයෝගීතාවෙන් කටයුතු කිරීම, තොරතුරු තාක්ෂණ සම්පත් සම්භාරය ශක්තිමත් කිරීම හා නිරතුරු නවීකරණය, මෙම ක්ෂේත්‍රයේ අන්තර් ජාතික ප්‍රවණතා අධ්‍යයනය සහ ගැලපෙන දේ අනුගමනය කිරීම දැනට ගත හැකි ප්‍රධාන පියවර ලෙස යෝජනා කළ හැක. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය තම එදිනෙදා කටයුතුවලට ප්‍රායෝගිකව යොදා ගැනීමේලා ආයතනයේ කාර්ය මණ්ඩලයේ ඇතැම් අය දක්වන පසුගාමී බව ඉක්මණින් මඟහැර ගතයුතු තත්වයකි. පුහුණු පාඨමාලා, උනන්දු කිරීම්, ඉහළ නිලධාරීන්ගේ ආදර්ශය හා අධීක්ෂණය මෙහිදී වැදගත් වේ.

## ජාතික මට්ටමේ සේවා සහ නායකත්ව භූමිකාව

ජාතික මට්ටමේ සේවා සහ දේශීය පුස්තකාල ක්ෂේත්‍රයේ නායකත්ව භූමිකාව ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය වෙත නිල බලයෙන් පැවරෙන වගකීම් වේ. ජාතික මට්ටමේ සේවා හා ව්‍යාපෘති ගණනාවක් ම පසුගිය දශක කිහිපය තුළ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය සාර්ථකව ක්‍රියාත්මක කර තිබීම මෙහි දී විශේෂ වාසි සහගත කරුණක් වේ. ප්‍රකාශන ආධාර ව්‍යාපෘති, ජාතික කියවීමේ මාසය ව්‍යාපෘතිය, අන්තර් ජාතික ප්‍රමිත අංක ව්‍යාපෘති, පුස්තකාල සංරක්ෂණ මධ්‍යස්ථාන පිහිටුවීමේ ව්‍යාපෘතිය ආයතනය මගින් දීර්ඝ කාලයක් නොකඩවා සාර්ථකව ක්‍රියාත්මක කරන ප්‍රමුඛ පෙලේ ව්‍යාපෘති වේ. මීට අමතරව පළාත් මධ්‍ය පුස්තකාල ව්‍යාපෘතිය, පුස්තකාලයාධිපතීන් සඳහා පුහුණු පාඨමාලා පැවැත්වීම, පුස්තකාල සඳහා තොරතුරු තාක්ෂණය හඳුන්වා දීම, සුනාමි පුස්තකාල සංවර්ධන වැඩසටහන පසුගිය සමයේ ජාතික මට්ටමින් සිදු කළ වෙනත් ප්‍රධාන ව්‍යාපෘති වේ. මෙම ප්‍රධාන වැඩසටහන් නවීකරණය කොට තවදුරටත් පවත්වා ගෙන යන අතර සංඛ්‍යාංකකරණය, අන්තර් ජාතික විද්‍යුත් වාර සඟරා ලබා ගැනීම, සමාජ මාධ්‍ය පුස්තකාල සේවා සඳහා යොදා ගැනීම, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ඒ ඒ පුස්තකාලවල හැකියාව සහ අවශ්‍යතාව

මුලදී සඳහන් කළ ලෙස තොරතුරු හා සන්නිවේදන ක්ෂේත්‍රයේ ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය අනාගතයේ ලබන ජයග්‍රහණ එහි ජාතික මට්ටමේ නායකත්ව භූමිකාව තීරණය කරනු ඇත. ශ්‍රී ලංකා ජාතික ඩිජිටල් පුස්තකාලය ගොඩනඟා, ජාතික පුස්තකාලයේ සම්පත් රටපුරා මෙන් ම ලොව පුරා සිටින පර්යේෂකයනට පරිහරණය කිරීමට අවස්ථාව ලබා දී, රට තුළ ඇති අනෙක් පුස්තකාලවලටද නව තාක්ෂණය උපයෝගීකරගෙන අන්තර්ජාතික මට්ටමේ උසස් පුස්තකාල සේවා වර්ධනයට සහායවීම ජාතික පුස්තකාලයේ වගකීම වේ. සෑම ශ්‍රී ලාංකිකයෙකුටම මෙන්ම රට පුරා විහිදුණු සියලුම පාසල්, උසස් අධ්‍යාපන, පර්යේෂණ, රාජ්‍ය, පෞද්ගලික, ස්වේච්ඡා ආයතන ව්‍යුහයට අවශ්‍ය තොරතුරු, දැනුම පසුවෙන් ලබාගත හැකිවන ලෙස කටයුතු කිරීම ජාතික පුස්තකාලයේ වගකීම වේ.

එසේ ම යටත් විජිත පාලකයින් විසින් අප රටෙන් අනීත්‍යානුකූලව පැහැර ගෙන ගොස් විදේශ රටවල පුස්තකාලවල, පෞද්ගලික එකතුවල සහ වෙනත් සංස්කෘතික ආයතනවල තැන්පත් කර ඇති අපේ ජාතික උරුමයන් වන දේශීය පුස්කොළ පොත් සහ වෙනත් සංස්කෘතික දායාදවල ඩිජිටල් පිටපත් හෝ මුල් පිටපත් නැවත අප රටට ලබා ගෙන ජාතික එකතුවට එක් කර ගැනීම ද ජාතික පුස්තකාලයේ වගකීම වේ. අනුරාධපුර, පොළොන්නරු යුගවල ශ්‍රී ලංකාව සමඟ සමීප සංස්කෘතික සබඳතා තිබූ රටවල් වූයේ ඇෆ්ගනිස්ථානය, ඉන්දියාව, චීනය, ටිබෙටය, මියන්මාරය, ලාඕසය, තායිලන්තය වැනි ආසියාතික රාජ්‍ය වේ. මේ අවධියේ ධර්ම ගවේෂණය, වෙළඳ කටයුතු, දේශපාලනික හෝ සංස්කෘතික සබඳතා මත මෙරටට පැමිණි හෝ ශ්‍රී ලංකාවෙන් මෙම රටවලට ගිය සංචාරකයින් සමඟ අපේ පැරණි පොතපත ද මෙම ආසියාතික රටවලට යාමට ඉඩ ප්‍රස්ථා තිබූ බව ප්‍රකට කරුණකි. ඒ අනුව දැනට අප රටින් අතුරුදහන් වී ඇති හඳුනාගත් සහ හඳුනානොගත් අපේ පැරණි විද්වත් ශාස්ත්‍රීය කෘති, තවමත් මෙම රටවල ආරාමවල හා පුස්තකාලවල ඇති, සියදහස් ගණන් හඳුනා නොගත් පුස්කොළ පොත් අතර තිබීමට බොහෝදුරට ඉඩ ඇත. මේවා සොයා ගොස් ඒවායේ ඩිජිටල් පිටපත් හෝ මුල් පිටපත් අප රටට ලබා ගැනීම ද ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ දිගුකාලීන වගකීමක් වේ.

සාර්ථකව මෙහෙයවීමට ජාතික පුස්තකාල කාර්ය මණ්ඩලය මෙන්ම රට තුළ සිටින පුස්තකාල, තොරතුරු තාක්ෂණ, සංරක්ෂණ, කළමනාකරණ ක්ෂේත්‍රවල විද්වතුන්ගේ සහාය ලබා ගැනීමටත් ජාතික පුස්තකාලයට සිදු වේ.

## මානව සම්පත් වර්ධනය

ජාතික පුස්තකාලයේ සාර්ථකත්වය එහි කාර්ය මණ්ඩලයේ ගුණාත්මකබව මත බොහෝ දුරට රැඳී ඇත. එබැවින් මෙම මානව සම්පත ආරක්ෂා කිරීම සහ තවදුරටත් සංවර්ධනය කරලීමට ද, උසස් මානව සම්පත් ආයතනයට ආකර්ෂණය කර ගැනීමට ද විශේෂ ප්‍රයත්නයක් දැරිය යුතු වේ. අනෙකුත් වෘත්තීය සුදුසුකම්වලට අමතරව, තොරතුරු තාක්ෂණ කුසලතා, ඉංග්‍රීසි හෝ වෙනත් දෙවන භාෂා දැනුම, කැපවීමෙන් සේවය කිරීමේ හැකියාව, කළමනාකරණ කුසලතා, උසස් මහජන සම්බන්ධතා ජාතික පුස්තකාල කාර්ය මණ්ඩලයෙන් අපේක්ෂා කෙරේ. කිසිදු ආයතනයකට තමනට අවශ්‍ය පූර්ණ මානව සම්පත් අත්කර ගැනීම ප්‍රායෝගිකව කළ නොහැක්කකි. එබැවින් තම කාර්ය මණ්ඩලයට අමතරව බාහිර විශේෂඥ සහාය අවශ්‍ය අවස්ථාවල දී ලබා ගැනීමට ආයතනයට අවස්ථාව ඇත. දැනට ඇති උපදේශක කමිටු මේ සඳහා බහුලව යොදා ගනු ලබන ක්‍රමය වේ. මීට අමතරව කෙටි කාලීනව, හඳුනාගත් සුවිශේෂ කාර්යයන් සඳහා විශේෂඥ සහාය ලබා ගැනීමට පහසුකම් ඇත. වෙනත් ජාතික පුස්තකාල සමඟ සබඳතා පුළුල් කිරිම මගින් හෝ දැනටමත් පවතින දකුණු ආසියා කලාපීය සහයෝගීතා සංගමය (SAARC) වැඩසටහන යටතේ කලාපීය ජාතික පුස්තකාල සමඟ කාර්ය මණ්ඩල හුවමාරු වැඩ සටහන් ඵලදායී වේ. 2015 පෙබරවාරි මස නව ශ්‍රී ලංකා ජනාධිපතිතුමාගේ ඉන්දීය සංචාරයේ දී ශ්‍රී ලංකාවේ පුස්තකාල, ලේඛනාගාර හා කෞතුකාගාර සංවර්ධනය සඳහා ඉන්දීය ආධාර ලබාදීමට අත්සන් කළ ශ්‍රී ලංකා - ඉන්දීය සංස්කෘතික ගිවිසුම මෙහිදී අතිශයින් වැදගත් වේ. මෙම ගිවිසුමින් උපරිම ඵල නෙලා ගැනීමට ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය සැලසුම් සහගතව කටයුතු කළ යුතු වේ.

විශ්වවිද්‍යාලවල සහ ඒවාට සම්බන්ධ ආයතනවල ජ්‍යෙෂ්ඨ අධ්‍යයන කාර්ය මණ්ඩලයට ඇති සප්ත වාර්ෂික නිවාඩු වැඩසටහන යටතේ විශේෂ අංශවල සුවිශේෂ කුසලතා ඇති විශේෂඥයින් වසරකට හෝ දෙකකට ජාතික පුස්තකාලයට අනුයුක්ත කර ගැනීම විශේෂයෙන් අවධානය යොමු කළ

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ ඉඩකඩ පිළිබඳ ගැටලුව දැන් දැන් ක්‍රමයෙන් දැනෙමින් පවතී. මෙම කතුවරයා අනාගතයේදී පැන නැගිය හැකි මෙම ගැටලුව පිළිබඳව 1980 ගණන්වල, ජාතික පුස්තකාලයේ යුනෙස්කෝ ගෘහ නිර්මාණ ශිල්පී, අභාවප්‍රාප්ත මහාචාර්ය මයිකල් බ්‍රෝන් මහතා සමග සාකච්ඡා කරන ලදී. එහි දී ඒ මහතා සඳහන් කළේ එබඳු ගැටලුවක් අනාගතයේ පැන නැගුනහොත් එයට විසඳුම් දෙකක් ඇති බවයි. මුල් විසඳුම ගොඩනැගිල්ලේ ජාතික පුස්තකාල එකතුව තැන්පත් කර ඇති ඇතුළත ප්‍රදේශය වටා ඇති බිත්තිය ඉවත් කිරීම මගින් අමතර ඉඩ ප්‍රමාණයක් ලබාගැනීම වේ. දෙවන විසඳුම ලෙස එතුමා සඳහන් කළේ ගොඩනැගිල්ලට ශක්තිමත් අත්තිවාරමක් සහ පුළුල් කුලුණු යොදා ඇති නිසා පහසුවෙන් තවත් අමතර මහල් කිහිපයක් එයට එක් කළ හැකි බවයි. එසේ වුව ද එතුමා මෙම අදහස් තම නිල වාර්තාවල ඇතුළත් කර නැති බව මෙහි දී සඳහන් කළ යුතු වේ.

මුල් විසඳුම නිසා දැනට ආරක්ෂිත ප්‍රදේශයක, වායු සමීකරණ කලාපයක පවත්වාගෙන යන ජාතික එකතුවට තවදුරටත් එම සුවිශේෂී ආරක්ෂිත බව ලබාදීම අපහසු වීමට ඉඩ ඇත. එසේම එම ඇතුළත බිත්ති ඉවත් කිරීම නිසා විශාල අමතර ඉඩ ප්‍රමාණයක් ද නො ලැබේ. එබැවින් දෙවන විසඳුම වූ ගොඩනැගිල්ලට අලුතින් මහල් කිහිපයක් එක් කර ගැනීම සලකා බැලිය යුතු කරුණකි. අලුතින් තනන බොහෝ ගොඩනැගිලි මෙලෙස ඉහළට ව්‍යාප්ත වීමට පහසුකම් ඇතිව නිර්මාණය කෙරේ. ජාතික පුස්තකාල ගොඩනැගිල්ලේ වඩාත් පුළුල් මහල එහි දෙවන මහල බැවින්, එහි සිට ඉහළට ඒ ප්‍රමාණයේ නව මහල් දෙකක් හෝ තුනක් එක් කළ හැකි නම් දැනට පවත්නා ඉඩකඩ පිළිබඳ ගැටලුව සැලකිය යුතු කාලයකට විසඳේ. එම නව මහල් විවිධ කාර්යයන් සඳහා යොදා ගත හැකි පරිදි සැලසුම් සහගතව තැනිය හැකි අතර විදුලි සෝපාන පද්ධතියකින් පාඨකයිනට සහ කාර්ය මණ්ඩලයට ප්‍රවේශ පහසුකම් සැපයිය හැකි වේ. කෙසේ වෙතත් මේ පිළිබඳ අවසාන නිගමනය ගෘහ නිර්මාණ ශිල්පීන් හා ගොඩනැගිලි ඉංජිනේරුවන් ජාතික පුස්තකාල ගොඩනැගිලි සැලසුම් සහ ගොඩනැගිල්ල පරීක්ෂා කොට ලබාදිය යුතු වේ. මෙලෙස අතිරේක ඉඩ පහසුකම් සපයා ගතහැකි නම් දැනට ආයතනයට අඩුපාඩු ලෙස ඇති උසස් මට්ටමේ ශ්‍රවණාගාරයක්, පාඨකයින් සඳහා විශේෂ පහසුකම්, කාර්ය මණ්ඩලය සඳහා අමතර ඉඩකඩ සහ පුළුල් වන ජාතික පුස්තකාල එකතුව තැන්පත් කර ලීම සඳහා අවශ්‍ය ඉඩකඩ ලැබේ. එසේ ම ඉදිරියේ දී ඇරඹීමට නියමිත ජාතික

පුද්ගලයන්ගෙන් සමන්විත වේ. පාලක මණ්ඩලය සමඟ කටයුතු කිරීමේ දී එහි විශ්වාසය හා ගෞරවය දිනාගත හැකි ලෙස උසස් වෘත්තීය මට්ටමකින් කටයුතු කිරීම අවශ්‍ය වේ. නිශ්චිත කාල වකවානුවල මණ්ඩල රැස්වීම් පැවැත්වීම, රැස්වීම් වාර්තා, මණ්ඩල පත්‍රිකා, පැහැදිලි, නිවැරදි හා උසස් මට්ටමකින් ඉදිරිපත් කරලීම, වාර්ෂික සැලසුම්, දිගුකාලීන සැලසුම්, ප්‍රගති වාර්තා, අයවැය ලේඛන, විශේෂ ව්‍යාපෘති ආදිය ක්‍රමානුකූලව සකස් කිරීම හා ඉදිරිපත් කිරීම මෙහි දී විශේෂයෙන් වැදගත් වේ. මෙම කටයුතුවල දී බාහිර විශේෂඥ සහාය ලබා ගැනීම ඵලදායික වේ. සෑම පාලක මණ්ඩලයක් ම විගණකාධිපති වාර්තා හා එහි දැක්වෙන විවේචන හා නිර්දේශ පිළිබඳ සුවිශේෂ අවධානය යොමු කරනු ලබයි. ආයතනයේ කටයුතු පිළිබඳව හා විගණකාධිපති වාර්තාව පිළිබඳ සාකච්ඡා කිරීමට මුළු පාලක මණ්ඩලය ම වාර්ෂික ව පාර්ලිමේන්තු කෝප් (COPE) කමිටුව වෙත කැඳවනු ලබන බැවින්, එහි දී දෝෂාරෝපණයට ලක්වීම අදාළ අමාත්‍යාංශයටත්, පාලක මණ්ඩලයටත්, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයටත් ගැටලුවක් වේ. එබැවින් එම තත්වයන් වළකා ගැනීමට හෝ අවම කර ගැනීමට කළමනාකාරිත්වය විශේෂයෙන් වගබලා ගත යුතු වේ.

යහපත් මූල්‍ය කළමනාකරණය හා උසස් කාර්ය මණ්ඩල කළමනාකරණය ආයතනයේ පරිපාලන කටයුතුවලදී තීරණාත්මක, වැදගත්කමක් උසුලනු ලබයි. සියලුම අංශ ප්‍රධානීන්ට තම වගකීම් නිශ්චිත ව පැවරිය යුතු අතර අදාළ අංශවල ප්‍රගතිය මාසිකව, ත්‍රෛමාසිකව සහ වාර්ෂිකව නිරතුරුවම සොයා බැලීම අත්‍යවශ්‍ය වේ. මූලික වගකීම් කෙරෙහි අවධානය හා අදාළ නො වන දෑ වෙනුවෙන් සම්පත් කැප නො කිරීම, කාලය කළමනාකරණය, යහපත් මහජන සම්බන්ධතා, සන්නිවේදන කුසලතා, ආතති කළමනාකරණය හා නිරතුරුව සූදානමින් සිටීම ඕනෑම ආයතනයක කළමනාකාරිත්වයට වැදගත් ගුණාංග වේ. නිරතුරුවම විද්‍යුත් තැපැල සහ සමාජ මාධ්‍ය තම කටයුතු සඳහා යොදා ගැනීමට ආයතනයේ සියලු නිලධාරීන් ද, විශේෂයෙන් ඉහළ කළමනාකාරිත්වය ද අමතක නො කළ යුතු වේ. එය තම ක්ෂේත්‍රයේ වෘත්තිකයන් සමඟ සමීප සබඳතා පවත්වා ගැනීමට ද, ඉක්මණින් හා සාර්ථකව අවශ්‍ය කටයුතු ඉටුකර ගැනීමට ද, සිය පෞරුෂ වර්ධනයට ද, ආයතනයේ ගෞරවයට ද හේතු වේ.

මෙම අභියෝග එක්වරම පහසුවෙන් ජයගත හැකිවනු ඇතැයි අපේක්ෂා කළ නො හැක. ඒ සඳහා මනා දැක්මක්, කැපවීමක් හා විශාල වෙහෙසක්

CDNL (Conference of Directors of National Libraries): www.cdnl.org

Kirchhoff, T, Schweibenz, W, & Sieglerschmidt, J (2008), Archives, Libraries, Museums and the spell of ubiquitous knowledge, Archival Science, Vol. 8

National Library and Documentation Services Board Act No. 51 of 1998, Colombo, Government Publication Bureau

National Library Advisory Committee of NLDSB (2014), Minutes of the NL Advisory Committee on 11.11.2014 (unpublished)

Skarstein, Vigdis Moe (2009), Strategies for a Digital National Library, 75th IFLA General Conference and Council, Milan, Italy

SLNLSB (1990), Board Paper No. 200/1990 on Future Plans of the National Library of Sri Lanka, Colombo, SLNLSB

UNESCO (1989), Definition of Cultural Heritage: ICCROM Working Group 'Heritage and Society', Paris, UNESCO

Walia, Paramjeet & Gupta, Monica (2012), Application of web 2.0 tools by national libraries, Webology, Vol. 9, No. 2

www.topsrilanka.com/article 39239. Lanka's computer literacy rate best in South Asia

Zuccala, Alesia (2008), Managing and evaluating digital repositories, iR information research, Vol. 13, No.1



## උපාලි අමරසිරි

බී. ඒ. (ගෞරව) (පේරාදෙණිය), පුස්තකාල විද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමා (ලෆ්බරෝ), ශාස්ත්‍රපති (ලෆ්බරෝ), ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සම්මාන අධි සාමාජිකත්වය, අධ්‍යක්ෂ ජනරාල්, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය (1989-2008), අධ්‍යක්ෂ, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය, කොළඹ විශ්ව විද්‍යාලය (2008-2014), සභාපති, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය (2009-2012), සභාපති, දකුණු ආසියා කලාපීය පුස්තකාල සංගම් සංවිධානය (2010-2012)




# ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ප්‍රතිපත්තිය සහ පාසල් පුස්තකාල සේවාව

එච්. එම්. ගුණරත්න බණ්ඩා

**සාරාංශය**

*මෙම ලිපිය මූලික වශයෙන් කොටස් දෙකකින් සමන්විතයි. මුල් කොටසින් ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඉටු කළ යුත්තේ කෙසේද යන්න විස්තරාත්මකව විග්‍රහ කෙරේ. වර්තමාන ජන ජීවිතයේ සෑම කාර්යයකටම අධ්‍යාපනය ඍජුවම හෝ වක්‍රාකාරයෙන් බලපාන බැවින් මේ සම්බන්ධව ප්‍රමුඛත්වය ලබාදීම අත්‍යවශ්‍යය. ශ්‍රී ලංකාවේ පාසල් පුස්තකාල සේවාව අන් රටවල මෙන් ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථාන වශයෙන් ද ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියට සමගාමීව සම්පත් පාදක ඉගෙනුම යටතේ වර්ධනය වීමේ කාලීන අවශ්‍යතාව ද පෙන්නුම් කෙරේ. ශ්‍රී ලංකාවේ පාසල් පුස්තකාල සේවාවේ ගුණාත්මක වර්ධනයක් සඳහා අවශ්‍ය යෝජනා ද මෙහි අන්තර්ගතය. ඒවා බලධාරින්ගේ, ප්‍රතිපත්ති තීරකයන්ගේ අවධානයට ලක් වී ප්‍රතිකාර්ය විසඳුම් ලබාදීම අගය කළ යුතුය.*

**මූලික පද -** *අධ්‍යාපනය, විෂය මාලාව, ගුරු අධ්‍යාපනය, පාසල් පුස්තකාල*

## හැඳින්වීම

අධ්‍යාපනය යනුවෙන් බොහෝ දෙනෙකුගේ ක්ෂණික අවධානය වර්තමානයේ දී යොමු වනුයේ පාසල් අධ්‍යාපනය කෙරෙහිය. අධ්‍යාපනය ඉකුත් කාලය තුළ බෙහෙවින් පුළුල් අර්ථයක් දෙනු ලබන වඩාත් ව්‍යාප්තව ගිය සංකීර්ණ ක්ෂේත්‍රයක් බැව් බොහෝ දෙනා අමතක කරති.

වර්තමානයේ දී අධ්‍යාපනය ප්‍රධාන කොටස් තුනකින් සමන්විතව ඇත. ඒ සඳහා සාමාන්‍ය පාසල් හා පිරිවෙන් අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය හා තෙවනුව ජනතාවගේ අධ්‍යාපන අවශ්‍යතා සපුරාගනු පිණිස රජයේ හා පෞද්ගලික අංශය විසින් වෘත්තීය, තාක්ෂණය හා ප්‍රජා අධ්‍යාපනය සඳහා ඇති විවිධ ව්‍යාපෘති ද ඇතුළත් ය.

අඩ සියවසකට අධික කාලයක් මෙරට නිදහස් අධ්‍යාපනය ක්‍රියාත්මක වෙයි. එහෙත් අධ්‍යාපනයේ අපේක්ෂිත සමස්ත සංවර්ධනයක් සමාජයට උරුමකර දී නො මැති බව සෑම අංශයකින් ම විද්‍යාමාන වී ඇත. අධ්‍යාපනය ලද අය තුළ නිර්මාණශීලී බව, ගැටලු විසඳීමේ හැකියාව, බුද්ධිමත් තීරණවලට එළඹීමේ දක්ෂතා, ජාතික සංවර්ධනය සඳහා කැපවීමේ හුරු පුරුදු, සාමාජයීය පැවැත්මට ඉවහල් වන ආකල්ප සහ සහජීවනය අර්ථවත් කරන සදාචාරාත්මක පැවතුම් හා සමබර පෞරුෂ වර්ධනයක් ගොඩ නැගෙන ආත්මාභිමානයෙන් පරිපූර්ණත්වයට පත් නො වීම හේතුවෙන් ඇති රැකියා අවස්ථා සඳහා පාසල් පද්ධතියෙන් පිටත තරුණ පෙළ නොගැලීම නිසා උද්ගත වූ විෂම රැකියාවන් ද නිර්මාණය වී ඇත. ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සම්බන්ධයෙන් ඉහත කී කරුණු පිළිබඳව පුළුල් වශයෙන් සාකච්ඡා සිදු වේ. සමාජයීය, දේශපාලනික හා ආර්ථිකමය අපේක්ෂා භංගත්වයන් නිසා උද්ගතව ඇති අසහනය හා නොසන්සුන්කම සමස්ත සමාජ පද්ධතියම සසල කිරීමට සමත් ව ඇත. මෙම විෂමතා මඟහරවා ගැනීමට ජාතික සංවර්ධනයේ ද අධ්‍යාපන ප්‍රතිපත්ති තුළින් විද්‍යමාන විය යුතු වේ.

## ශ්‍රී ලංකාවේ වර්තමාන සාමාන්‍ය අධ්‍යාපන ක්‍රමය

ශ්‍රී ලංකාව බහු ජාතික, බහු ආගමික හා විවිධ භාෂා කථා කරන රටකි. ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර යුගයේ පටන් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ අධ්‍යාපන ක්‍රමය මගින් නොමිලේ පොත්පත්, ඇඳුම් සහ දිවා ආහාර ද ලබා දෙන අතර ජාතික ධනයෙන් විශාල ප්‍රමාණයක් අධ්‍යාපන කටයුතු සඳහා වැය කරනු ලැබේ. අධ්‍යාපන අමාත්‍යාංශයේ සැලසුම් අංශයේ පාසල් සංගණන වාර්තා වාර්ෂිකව සංඛ්‍යාලේඛන දත්ත රැස් කිරීමෙන් යාවත්කාලීන කෙරේ. එම සංඛාලේඛනවලට අනුව වාර්ෂිකව පළමු වසර සඳහා පාසලට ප්‍රවේශවන ශිෂ්‍ය සංඛ්‍යාව වාර්ෂිකව වර්ධනය වන අතර 2013 වර්ෂයේ දී පමණක් ලක්ෂ 05 ඉක්මවා ඇති බවට වාර්තා කර ඇත.

වර්තමාන ලෝකය ශීඝ්‍ර ලෙස වෙනස් වෙමින් පවතී. මෙම ප්‍රවණතා සමඟ ශ්‍රී ලංකාව ද ඉදිරියට යා යුතු වේ. මේ ක්‍රියාවලියේ දී අධ්‍යාපන ක්ෂේත්‍රයට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි.

## ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ පරමාර්ථ සහ අරමුණු

මෙරට බොහෝ දෙනෙක් උසස්, ජනප්‍රිය පාසලකට තම දරුවා ඇතුළත් කර ගැනීම, විභාගවලට පෙනී සිට සහතික ලබාගැනීම සැබැවින් ම ප්‍රකට කරුණකි. එහෙත් අධ්‍යාපනයේ අර්ථය එය නො වෙයි. මනුෂ්‍යත්වයේ උපරිම ලක්ෂණය හා දක්ෂතා ඇති සාමකාමී සහජීවනයෙන් මුළු ලෝකය සමඟ ජීවත් විය හැකි සැබෑ මිනිසෙකු තැනීම අධ්‍යාපනයේ පරමාර්ථයයි. තෘප්තිමත් සමාජ සංස්ථාවක් බිහි කිරිමේ මූලික අවශ්‍යතාවක් සපුරාලනු ලබන අධ්‍යාපනයක් ප්‍රධානතම අරමුණු අපේක්ෂිත පරිදි පසුගිය වකවානුව තුළ ඉටු වූ බවක් නො පෙනේ. එසේ නම් මෙරට අධ්‍යාපනයේ ව්‍යුහය, ක්‍රම, ක්‍රියාවිධි, විෂය මාලාව හා සන්ධාරය ආදී අධ්‍යාපනයට අදාළ සියලු අංශයන් කෙරෙහි නැවත අවධානය යොමු කිරීම ද අද සිදුව තිබේ. එම කරුණුවල ඇති සාධනීය කරුණු කෙරෙහි පමණක් අවධානය යොමු කරලීම සුදුසුය. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණය ඒ අනුව කාලීන අවශ්‍යතාවක් බවට පත් වී ඇත.

අධ්‍යාපන අරමුණු පිළිබඳව ජෙරෝම් එස් බෲනර් (1966) මෙසේ පවසයි.

**'' අධ්‍යාපනය මගින් විශිෂ්ටත්වය වර්ධනය කිරීම අධ්‍යාපනයේ පොදු අරමුණු වශයෙන් යෙදෙනුයේ කවර අර්ථයෙකින් දැයි පැහැදිලි විය යුතුයි ''** (Toward a theory of instruction, P. 72)

මෙහි දී ශිෂ්‍යයාට ඉගැන්වීම පමණක් ම අදහස් නො කෙරේ. එක් එක් ශිෂ්‍යයාට ලැබිය හැකි උපරිම බුද්ධිමය සංවර්ධනය ලබා ගැනීමට ඔහුට උපකාරිවීම ද ඒ සමඟම එයින් අදහස් කෙරේ. වෙනස්කම් කළ යුතු තැන් කවරේදැයි පරීක්ෂාකාරී ගවේෂණ හා පර්යේෂණ මගින් අපට සොයා ගත හැකිය.

උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ දී විශ්වවිද්‍යාලයේ පරමාර්ථ, ආකෘතිය හා සංවිධාන යන සියල්ලන්හි වෙනස්කම් ඇති කිරීමේ අවශ්‍යතාවය දැනට පවතින විශ්වවිද්‍යාලයන්හි අර්බුදය පෙන්නුම් කරයි. එකී තත්ත්වයට වාර්ෂිකව ඇතුළත්වන ශිෂ්‍ය සංඛ්‍යාව, රජයේ මුදල් ප්‍රතිපාදන, විශ්වවිද්‍යාලයේ ස්වාධීනත්වය, පාඨමාලා අදාළත්වය යන විමර්ශන චින්තනය ආදී ප්‍රශ්න පදනම්ව පවතී. මේවා දෙස බැලිය යුතු වනුයේ පටු

වර්ෂ 1999 දී ක්‍රියාත්මක කිරීමට යෙදුණ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මගින් අධ්‍යාපනයේ ගුණාත්මකබව ඉහළ නැංවීම සඳහා සම්පූර්ණ සැලැස්මක් සම්පාදනය කරන ලදී. එම සැලැස්මෙහි පහත සඳහන් කරුණු ඇතුළත් ය.

- ළදරු සංවර්ධනය පිළිබඳ වැඩසටහන් වැඩි දියුණු කිරීම
- ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමවේදී ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියට හඳුන්වා දීම.
- විෂය මාලාවන්, ගුරු පුහුණුව යන ගුණාත්මක යෙදවුම් සැපයීම් මගින් ප්‍රාථමික අධ්‍යාපන වැඩසටහන් වර්ධනය කිරීම
- දෙවන ජාතික භාෂාව ඉගැන්වීම හඳුන්වාදීම
- ප්‍රායෝගික ක්‍රියාකාරකම්වලට සහ ව්‍යාපෘතිවලට තැන දීම
- ශිෂ්‍යාගේ කැමැත්තට සහ විශේෂ අභියෝග්‍යතාවට ගැලපීම සඳහා විකල්ප විෂයන් තුනක් අ. පො. ස. (උසස් පෙළ) විෂය මාලාවට ඇතුළත් කිරීම

## අධ්‍යාපන ප්‍රතිපත්ති සහ රට සංවර්ධනයේ ඉෂ්ටාර්ථ

පසුගිය දශක දෙක තුන අතරතුර රටක අධ්‍යාපන පරමාර්ථ සහ අරමුණු අනුව සලකා බැලිය යුතු කරුණක් ලෙස එහි අධ්‍යාපනයේ අදාළත්වය ගත යුතු යයි විවිධ ප්‍රතිපත්ති සම්පාදන වාර්තා සහ කොමිෂන් සභා වාර්තා පෙන්වා දී ඇත. අදාළ බව හෝ අදාළ නැති බව තීරණය වන්නේ අධ්‍යාපන ක්‍රම සාක්ෂාත් කර ගැනීමට බලාපොරොත්තු වන පරමාර්ථ සහ අරමුණු හා සම්බන්ධ කර බැලීමේ දීය. බොහෝ ජාතීහු වර්තමාන සහ අනාගත අභියෝගයන්ට මුහුණ දීමට තරුණ පරම්පරාව සූදානම් කිරීම මෙන් ම ඉතිහාසය පුරා වර්ධනය වූ දැනුම ලබාදීමට ද අදහස් කරති. මෙය 1992 ජාතික අධ්‍යාපන කොමිසමේ අධ්‍යාපන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ මනාව පෙන්වා දී ඇත.

ජාතික පරමාර්ථවලට අදාළ වීමට නම් අධ්‍යාපනය ආර්ථික අංශයට ඇති අදාළත්වයට වැඩි අවධානයක් යොමු කළ යුතු වේ. අධ්‍යාපනය සහ ආර්ථිකය අතර ඇති නො ගැලපීම අධ්‍යාපනයේ නොව ආර්ථිකයේ ඌනතාවයක් ලෙස දැක්වේ. වර්තමානයේ දී දෙමව්පියන්ගේ මෙන්ම ශිෂ්‍යයන්ගේ ද අධ්‍යාපනය ලැබීමේ ප්‍රධාන ඉලක්කය වී ඇත්තේ උසස්

පෙළ තාක්ෂණික විෂයන් නැවත ව්‍යුහගත කර නවතම තාක්ෂණික විෂය ධාරාවක් හැඳින්වීමට ද පාසල් මට්ටමේ තාක්ෂණික හා ප්‍රායෝගික අධ්‍යාපනය පුළුල් කර වර්ධනය කිරීම කාලෝචිතය.

එසේ ම විශ්වවිද්‍යාල මට්ටමේ දී විෂය මාලා ප්‍රතිශෝධනය යටතේ ජාතික අවශ්‍යතාවයන්ට අනුව පාඨමාලා විවිධාංගීකරණයන් ඉංග්‍රීසි භාෂාව භාවිතය හා සමාජ කුසලතා අතරට තාක්ෂණික විෂය ධාරාවක් හැඳින්වීමට එය තාක්ෂණික විශ්වවිද්‍යාල මට්ටමින් උපාධි මට්ටමට ගෙන යාමටත් ක්‍රියාත්මක කර ඇත. ශ්‍රී ලංකාවේ විවිධ ආගමික, වාර්ගික, සංස්කෘතික කණ්ඩායම් අතර සාමුහික පැවැත්ම සඳහා ආකල්ප වර්ධනයක් අවශ්‍ය වේ. දෙවනුව විශ්ව සමාජය හා ශ්‍රී ලාංකික සමාජය යන සාමාජිකයෙකු වීම සඳහා ළමයා සූදානම් කිරීම සඳහා අනාගතයට විශ්ව අගයන් සහ සංස්කෘතියට විශේෂිත හරාත්මක අගයන් ද අතර සමබරතාව රැක ගැනීම අවශ්‍ය වේ. අධ්‍යාපන පද්ධතියේ සංවර්ධනයට අවශ්‍ය භෞතික සම්පත් හා යටිතල පහසුකම්, ගුරු පුහුණුව, ගුරු බලවත්කරණය, ඉගෙනුම්කරණය සඳහා සම්පත් ඌනතාවයක් ඇත. රාජ්‍ය භාණ්ඩාගාරයෙන් පමණක් නොව ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව සහ වෙනත් විදේශීය ආධාර රටේ අධ්‍යාපනය සඳහා ගලා එන අවස්ථාවල දී එම මුදල් උපරිම ලෙස භාවිතයට ගැනේ දැයි සැක සහිතය. එහෙයින් විදේශ මුදල් අධ්‍යාපනය සඳහා යෙදවීමේ දී විචාරශීලිව කටයුතු කිරීම කාලීන අවශ්‍යතාවයකි.

## සම අධ්‍යාපන අවස්ථා

කුඩා පාසල්වල ඉගෙනීම් - ඉගෙනුම් මට්ටම පහළ යාම, පාසල් නො යන සිසුන් නැවත රැඳීම, ගිලිහී යාම යනාදී ප්‍රශ්න බොහෝ විට ඒ ඒ පාසල හා සම්බන්ධ ලෙසට කල්පනා කළත් ඒවා සමාජ ආර්ථික පරිසරයේ බලපෑම් විදහා දැක්වෙන ප්‍රශ්න වේ. දියුණු අධ්‍යාපනය තාක්ෂණය යොදා ගනිමින් සියලු පහසුකම් සහිත ජාත්‍යන්තර පාසල් සමඟ සමාන්තරව කුඩා ගම්බද හෝ නාගරික පාසල් ක්‍රියාත්මක වන්නේ නම් එය සම අධ්‍යාපන අවස්ථා උදා කිරීමකි.

ශ්‍රී ලංකාවේ පාසල් යන වයසේ අවුරුදු 5 -14 අතර ළමයින්ගෙන් 17 % ක් ජාතික අධ්‍යාපන ආයතනයේ පර්යේෂණයන්ට අනුව පාසල් නොයති.

පාසල්වල විද්‍යා, ගණිත සහ ඉංග්‍රීසි ගුරුවරු හිඟයක් පවතී. සුදුසු විද්‍යාගාර ඇත්තේ කොපමණද? මූලික පහසුකම් වැසිකිළි කැසිකිළි සහ බීමට ඇති පානීය ජලය නො මැති දුෂ්කර පාසල් ඇත. මේවායේ අධ්‍යාපනික ගුණාත්මක තත්ත්වයන් සාධනීය මට්ටම් ඉහළ නැංවීම ගැටලුවක් ව පවතී. සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ම අංග සම්පූර්ණ පාසල් තුන බැගින් සංවර්ධනය කර පාසල් දහසක් සුපිරි පාසල් තත්ත්වයකට ගෙන ඒමට ප්‍රයත්න දරනු පෙනේ. ඒ අනුව මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර තෝරාගත් පාසල්වල ඉදිවෙනු දක්නට ලැබේ. මේවායින් උපරිම ප්‍රයෝජන ලබාගත හැකි අයුරින් සැපයුම් කටයුතු ප්‍රසම්පාදනය විය යුතුය.

අ. පො. ස. (උසස් පෙළ) විභාගයේ ප්‍රශ්න පත්‍ර හතරක් වෙනුවට තුනක් දක්වා අඩු කර තාක්ෂණවේදය විෂය ධාරාවක් ලෙසට හඳුන්වා දී ඇත. සමහර විද්‍යා විෂයන් කිහිපයක් එකතු කර විෂය මාලා සම්පාදනය සිදු කර ඇත. මෙහි දී ලෝකයේ අනෙකුත් රටවල පවත්නා තත්ත්වයන් අධ්‍යයනය කළ යුතු වන්නේ විශ්ව සමාජයට ගැලපෙන දරුවෙකු නිර්මාණය කිරීම අත්‍යාවශ්‍ය වන බැවිනි. විශ්වවිද්‍යාල විසින් අතිරේක පාඨමාලා එනම් ඩිප්ලෝමා, සහතික පත්‍ර පාඨමාලා ආරම්භ කර ඇත. එහෙත් සමහර විෂයන්හි විෂය මාලා සංශෝධනය කාලානුරූපී සංශෝධනයකට භාජනය වී නො මැත. මේ සඳහා පර්යේෂණ කිරීමට උනන්දු කර ඒ මත නව වෙනස්කම් හඳුන්වාදීම සුදුසුය. පවතින අධ්‍යාපනය තුළ ප්‍රමාණාත්මක වර්ධනයක් පෙන්නුම් කළ ද ගුණාත්මක වර්ධනයක් දක්නට නො ලැබෙන බව ප්‍රසිද්ධ විභාගවලින් පැහැදිලි වී ඇත. එසේම වාර්ෂිකව අධ්‍යාපනික ඉනිමගින් අ.පො.ස. (සා.පෙ.) ට ළඟා වීමට පෙර ඇද හැලෙන සංඛ්‍යාව ද ඉහළ මට්ටමක ඇත. පාසල්වලින් හා විශ්වවිද්‍යාලවලින් වාර්ෂික ව පිටවන පිරිස ද රැකියා අපේක්ෂිතව සිටිති. එහෙත් රජයේ මෙන් ම පෞද්ගලික අංශයේ රැකියා සඳහා ඔවුන්ගේ දැනුම හා කුසලතා ප්‍රමාණවත් නො වීම ජාතික ගැටලුවක් බවට පත්ව ඇත. අධ්‍යාපන ප්‍රතිපත්ති අන්තර්ගතයන් සාමාන්‍ය අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය ඇතුළුව ප්‍රතිසංස්කරණයට භාජනය විය යුතු විෂය ක්ෂේත්‍ර මැනවින් හඳුනාගෙන ඇත. එම අන්තර්ගතය මෙහි දැක්වීම සුදුසු වනුයේ ඒ පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකි හෙයිනි.

සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය
සාහිත්‍ය (සිංහල. ඉංග්‍රීසි.දෙමළ)

අධ්‍යාපනය හා ජීවත් වීම යනු දෙකක් නොවේ. එකකි. එහෙත් අප පාසල්වල ඉගැන්වීම් රටාව තවමත් විශ්වවිද්‍යාල ප්‍රවේශයට පෙනී සිටින සිසුන් විෂයෙහි විවෘතව ඇත. ඒ සමග ම උසස් අධ්‍යාපනයට යා නො හැකිව වැඩි දෙනෙක් ලත වෙති. සරසවි අධ්‍යාපනයේ ද විභාග සමත්වීමේ නිපුණතා මිස ජීවත්වීමට අවශ්‍ය නිපුණතා ප්‍රගුණ නො කරයි.

නිශ්චිත තීරණයක් හෝ ගැනීමට ඔවුහු බොහෝ විට අසමත් වෙති. ඔවුන් තුළ හසුරු කුසලතා වුව ඇත්තේ මඳ වශයෙනි. සත්‍ය ජීවිත අත්දැකීම් පදනම් කර ගෙන නිපුණතා පාදක අධ්‍යාපනය යටතේ විෂය මාලාව සකස් කිරීම අගය කළ යුතු වේ. ව්‍යාපෘති පාදක අධ්‍යයනය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස 10 සහ 11 ශ්‍රේණි සඳහා හඳුන්වා දී ඇත. පාසලේ දී විවිධ විෂයයන් යටතේ ලබා ගන්නා න්‍යායාත්මක දැනුම දෛනික ජීවන ගැටලු විසඳා ගැනීම එදිනෙදා ජීවිතයට අවශ්‍ය කුසලතා සංවර්ධනය නව දැනුමක් මේ තුළින් ලැබේ. ජාතික අධ්‍යාපන ආයතනය විසින් 2005 වසරේ දී හඳුන්වා දී ඇති ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ අනුව ව්‍යාපෘති පාදක අධ්‍යාපනයේ පරමාර්ථ සැකවින් පහත දැක්වේ.

- කණ්ඩායමක් ලෙස ඉගෙන ගැනීමට හා වැඩ කිරීමට අවශ්‍ය කුසලතා සංවර්ධනය
- අඛණ්ඩ ඉගෙනුම හා ධනාත්මක ආකල්ප සංවර්ධනය
- පුද්ගල ශක්තීන් හා දුර්වලතා හඳුනාගෙන ආත්ම සාක්ෂාත් කරණයට අවස්ථා සම්පාදනය

අධ්‍යාපන ප්‍රතිපත්තිය හා රටේ සංවර්ධනය වර්තමානයේ අධ්‍යාපන පාරිභෝජනයක් නොව, ආයෝජනයක් ලෙස සැලකේ. විශේෂයෙන් ම දියුණු වෙමින් පවතින රටවල අධ්‍යාපනය තුළින් ඉටු වන ආර්ථික ප්‍රතිලාභ ලැබිය යුතුය. ආර්ථික ප්‍රතිලාභ ලබා ගැනීමට නම් අධ්‍යාපනයෙන් ලබන දැනුම සහ කුසලතා ආර්ථික ඵල ප්‍රයෝජන ලබා ගැනීමට හැකියාවක් තිබිය යුතුය. සංවර්ධනය වන රටවල් මුහුණපාන ප්‍රධාන ගැටලුවක් වනුයේ රැකියා වියුක්තියයි. මේ ප්‍රශ්නය විසඳීම සඳහා වෘත්තීය මාර්ගෝපදේශනය මෙන් ම කාර්යක්ෂම විද්‍යාත්මක හා තාක්ෂණික අධ්‍යයනයක් ලබා දීම යෝග්‍ය වේ. ද්විතීයික අධ්‍යාපනයෙන් ගිලිහෙන අය සඳහා නිෂ්පාදන

## බලපාන කරුණු

ජාත්‍යන්තර වෙළඳාම, සන්නිවේදන මාර්ගවල ශීඝ්‍ර දියුණුව හා විද්‍යාව හා තාක්ෂණය ඒ සඳහා භාවිත කිරීම රටක සංවර්ධනයේ ප්‍රධාන සාධක බවට පත් වී ඇත. වර්තමාන තාක්ෂණික ලෝකයට අවශ්‍ය කුසලතා පූර්ණ ශ්‍රමිකයන් බිහිකිරීම සඳහා පුළුල් විද්‍යාත්මක, තාක්ෂණික සහ සංස්කෘතික අධ්‍යාපනයක් ලබාදීම යුගයේ අවශ්‍යතාවයක් බවට පත් වී ඇත. මෙවැනි පසුබිමක් තුළ දී ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය ආර්ථික සංවර්ධනයට දායක නොවීමට බලපාන කරුණු විමසීම සුදුසුයි. ඒ අනුව පහත සඳහන් කරුණු කෙටියෙන් දැක්විය හැක.

- විෂය මාලාවේ ශාස්ත්‍රීය නැඹුරුව ශිෂ්‍යාගේ පෞද්ගලික සංවර්ධනයට මෙන් ම ශ්‍රී ලංකාවේ සංවර්ධනයට අදාළ කුසලතා ප්‍රමාණාත්මක ව දියුණු කර ගැනීමට උපකාරී නො වීම.
- ප්‍රායෝගික ක්‍රියාකාරකම් අවශ්‍යතාව ආචාර්ය සී.ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර යුගයේ සිට මේ දක්වා පෙන්වා දී ඇතත් ඒ සඳහා යොදාගත් උපාය මාර්ග සාර්ථක නො වීම.
- ජාත්‍යන්තර වැදගත් භාෂාවක් වන ඉංග්‍රීසි භාෂාව මෙන් ම වෙනත් භාෂාවක් පිළිබඳ දැනුම ලබා ගැනීමට ඇති බාධක ඉවත් කිරිමේ ඇති අපහසුකම.
- යාවජීව ශිෂ්‍ය කේන්ද්‍රීය වැඩිහිටි අධ්‍යාපනය උසස් කොට නොතැකුවත් ඒවා අඛණ්ඩව ගෙන යාමට වැඩසටහන් ක්‍රියාත්මක වුවත් ඒවා ඵලදායි ලෙස ඉටු නො වීම.
- රැකියා ක්ෂේත්‍රයක නිරතවීමට ප්‍රයෝජනවත් වන ගෘහ ආර්ථික විද්‍යාව, වඩු වැඩ, පෙදරේරු, විදුලි කාර්මික වැඩ ආදී විෂයයන් හැදෑරීම පිළිබඳ දක්වන අයහපත් ආකල්ප.
- ශිෂ්‍ය චින්තනයෙහි නිර්මාණාත්මක ලක්ෂණ වර්ධනයට යෝග්‍ය ස්වයං නිර්මාණ අගය කිරීමට ඉගැන්වීම් ක්‍රමවලින් අනුබල නො ලැබීම.

විභාග කේන්ද්‍ර කොට ගෙන පවත්නා අධ්‍යාපන ක්‍රමයක ගුරුවරුන් ද, ශිෂ්‍යයන් ද තම කාලය සහ ශ්‍රමය වැඩි වශයෙන් වැය කරන්නේ විභාග

ප්‍රතිපත්ති විශේෂ සහාය ඇති ව සම්පාදනය කිරීම අත්‍යාවශ්‍ය කරුණකි වනු ඇත. ශ්‍රී ලංකාවේ දැනට විශ්වවිද්‍යාල 15 ක ප්‍රමාණයක් රට පුරා ස්ථාපිත කර ඇත. විශ්වවිද්‍යාල යනු නව දැනුම උත්පාදනය සඳහා පර්යේෂණ දියත් කරන තැන්ය. විශ්වවිද්‍යාල පාඨමාලා නවීකරණය කර පැවැත්වෙන පාඨමාලාවල ගුණාත්මකභාවය වර්ධනය කිරීම අත්‍යාවශ්‍යය. ජාත්‍යන්තර පාසල් හා විශ්වවිද්‍යාල රට තුළ ස්ථාපිතවීම තුළින් ගුණාත්මක වර්ධනයක් ඇති වේ නම් එය යහපත් කරුණකි. අ.පො.ස. (උ.පෙළ) සමත් වී විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබා ගැනීමට නො හැකි වූ සිසුන් විදේශීය රටවලට යවා උසස් අධ්‍යාපනය ලබා දීමට දෙමව්පියෝ පෙළඹී සිටිති. ඒ සඳහා විශාල විදේශ විනිමයක් මෙරටින් විදේශීය රටවලට යැවේ. එසේ ම විදේශීය රටවල අධ්‍යාපනය ලබා සුදුසුකම් ලබන වැඩි දෙනෙකු එම රටවල පවත්නා ජීවන තත්ත්වය, ඉහළ වැටුප්, දරුවන්ගේ අධ්‍යාපන කටයුතු නිසා එම රටවල පුරවැසිභාවය ලබා ගනිති. ශ්‍රී ලංකාව ඔවුනගේ ප්‍රාථමික උසස් අධ්‍යාපනය සඳහා කොපමණ මුදල් ප්‍රමාණයක් වැය කර තිබේ ද යන කරුණ පිළිබඳව ස්වාධීන කරුණු විමසීමක් කර ප්‍රතිකාර්යය වැඩපිළිවෙළ සම්පාදනය කිරීම ජාතියේ අනාගත දියුණුව පිණිස හේතු වනු ඇත.

ශ්‍රී ලංකාවට අධ්‍යාපන සංවර්ධනය වෙනුවෙන් ලැබෙන විදේශ මුදල් ප්‍රතිපාදන, ණය ගෙවීම් උදාහරණ ලෙස ලෝක බැංකුව, ආසියා සංවර්ධන බැංකුව රටේ නිවැරදි සංවර්ධන ඉලක්ක මෙන් ම ඵලදායී අන්දමින් ආයෝජන කෙරේද? ඒවායින් රටේ අධ්‍යාපනයේ සැබැවින් ම වෙනසක් සිදු වේද යන්න ඉතා ප්‍රවේශමෙන් නිරීක්ෂණය කළ යුතුය. මේ සඳහා ගත හැකි විකල්පයක් වනුයේ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ගැටලු අප විසින් ම හඳුනාගෙන දේශීයත්වයට ගැලපෙන අධ්‍යාපන ක්‍රමයකට මෙම මුදල් වගකීමක් ඇති ව ආයෝජනය කිරීමයි.

රටක සංවර්ධනය මැනීමේ දී ඒක පුද්ගල ආදායම එක් සාධකයක් ලෙස ගැනේ. දළ දේශීය නිෂ්පාදිතය වර්ධනය සඳහා රාජ්‍ය අංශ සහ පෞද්ගලික අංශයේ ආදායම් ගණනය කෙරේ. ශ්‍රී ලංකාවේ වර්තමානයේ දී විදේශ විනිමය ලැබෙන එක් මාර්ගයක් වනුයේ නුපුහුණු ශ්‍රමිකයන් බහුතරයක් මැද පෙරදිග සේවයේ යෙදීමෙන් ලබන ආදායමයි. අධ්‍යාපන ප්‍රතිපත්තියක දී වෘත්තීමය අධ්‍යාපනය තුළින් පුහුණු ශ්‍රමිකයන් යැවිය හැකි අතර එමගින්

සාර්ථක අසාර්ථක භාවය පිළිබඳව පැහැදිලි අධ්‍යයනයන් ද සිදු කර වාර්තා එළිදක්වා ඇත. මේ සියල්ල පිළිබඳ ප්‍රත්‍යාවේක්ෂණ අධ්‍යයනයක් සිදුකර ශ්‍රී ලංකාව සඳහා නවතම අධ්‍යාපන ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම ප්‍රමුඛතාවය ලබා දී ඉටු කළ යුතු කර්තව්‍යයක් වනු ඇත.

ශ්‍රී ලංකාවේ වර්තමාන අධ්‍යාපනය, ක්‍රමවේද, විෂයමාලා ඉගෙනුම් ක්‍රමවේද, පරිගණක හා ඉංග්‍රීසි අධ්‍යාපනය සහ උසස් අධ්‍යාපනය යන ක්ෂේත්‍රවලින් දේශීය, විදේශීය පර්යේෂණ රාශියක් සිදු කර ඇත. ජාතික අධ්‍යාපන ආයතනය සහ NEREC ආයතනය (National Eduction Research Center), කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨය, පේරාදෙණිය විශ්වවිදලයේ අධ්‍යාපන පීඨය සහ විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨවල එවැනි පර්යේෂණ වාර්තා තැන්පත් කර ඇත. මෙම පර්යේෂණ වාර්තා අධ්‍යයනය කර වර්තමාන ජාතික ප්‍රශ්නවලට ගැලපෙන අයුරින් යෝජිත අධ්‍යාපන ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම සුදුසු ය. එහි දී දැනට ජාතික අධ්‍යාපන කොමිසමෙන් යෝජනා ප්‍රසිද්ධ පුවත්පත් මාර්ගයෙන් කැඳවා අදහස් ලබා ගැනීම සුදුසුවන අතර එය දේශපාලනකරණයෙන් තොරව සම්පාදනයවීම ඉතා වැදගත් ය. එයට හේතුව සමාජයක ජනතාවගේ ක්‍රියාකාරකම්වලට අධ්‍යාපනය බලවත් සාධකයක් වන බැවිනි.

## පාසල් පුස්තකාල සේවාව

පොත්පත් බොහෝ දුලබව පැවති අතීතයේ පුස්තකාලයක කාර්යභාරය වූයේ පොත්පත් ආරක්ෂා කර ගැනීමය. වර්තමානයේ දී දැනුම් විදාරණ යුගයකට පිවිස සිටී. මානව දැනුම ගබඩා කිරීම මුද්‍රිත විද්‍යුත් සහ අප්‍රකාශිත වශයෙන් මාධ්‍ය රැසක් බිහි විය. වරප්‍රසාද ලත් සුඛෝපභෝගී භාණ්ඩ බවට පත්ව තිබූ දැනුම් අඩංගු මාධ්‍යවලට වර්තමානයේදී පොදු ජනතාවගේ පරිශීලනය සඳහා අවකාශ ලබා දී ඇත. මුද්‍රිත ද්‍රව්‍ය, චිත්‍ර,සිතියම්, සටහන්, පෝස්ටර් ඇතුළු චිත්‍රමය ද්‍රව්‍ය, ශබ්දපට, වීඩියෝපට, විද්‍යුත් චුම්බක, චිත්‍රපට, පරිගණක දත්ත පදනම් සහ අන්තර්ජාල පුස්තකාල සම්පත් අතරට එක් වී සිටියි. අසීමිත දැනුම් අඩංගු මාධ්‍ය අතුරින් සිසුන්ට සුවිශේෂ ව අවශ්‍යවන තොරතුරු ලබා දීම කුසලතාවයක් ලෙස වර්ධනය කළ යුතුව ඇත. පාසල් පුස්තකාලයෙන් විවිධ දැනුම් සම්පත් පරිශීලනය කිරීමේ කුසලතාව ලබාගන්නා ශිෂ්‍යයා උසස් අධ්‍යාපන ආයතන සහ වෙනත් විශේෂ විමර්ශන පුස්තකාලවලින් නොපැකිල, නොබියව ප්‍රයෝජන ගැනීමට අවශ්‍ය කුසලතා

| 2013 | | පුස්තකාල හා ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථාන | | |
|---|---|---|---|---|
| පළාත | සමස්ත පාසල් සංඛ්‍යාව | ස්ථිර පුස්තකාල | තාවකාලික පුස්තකාල | කියවීම් කාමර |
| 1. බස්නාහිර | 1341 | 698 | 333 | 123 |
| 2. මධ්‍යම | 1513 | 392 | 392 | 209 |
| 3. දකුණ | 1106 | 522 | 275 | 140 |
| 4. උතුර | 974 | 204 | 136 | 116 |
| 5. නැගෙනහිර | 1074 | 303 | 231 | 180 |
| 6. වයඹ | 1229 | 466 | 290 | 151 |
| 7. උතුරු මැද | 787 | 252 | 197 | 127 |
| 8. ඌව | 864 | 288 | 173 | 101 |
| 9. සබරගමුව | 1124 | 339 | 259 | 157 |
| එකතුව | 10012 | 3464 | 2286 | 1304 |

| තොරතුරු තාක්ෂණ ඉගෙනුම් මධ්‍යස්ථානය | | | | | |
|---|---|---|---|---|---|
| පළාත | සමස්ත පාසල් සංඛ්‍යාව | පරිගණක 1.5 | පරිගණක 6.10 | පරිගණක 11.20 | පරිගණක 20 ට වැඩි |
| 1. බස්නාහිර | 1341 | 452 | 306 | 184 | 170 |
| 2. මධ්‍යම | 1513 | 605 | 234 | 144 | 76 |

**බස්නාහිර හා මධ්‍යම පළාතේ තොරතුරු තාක්ෂණ ඉගෙනුම් මධ්‍යස්ථාන**

අධ්‍යාපන ක්‍රමවේද වෙනස් වෙමින් පවතින අතර සම්පත් පාදක ඉගෙනුම, ගවේෂණශීලි ඉගෙනුම, විස්තාරණීය සහ විවෘත පාසල් අධ්‍යයන ක්‍රම යොදා ගැනීමේ දී පාසල් පුස්තකාලයේ ගුණාත්මක සංවර්ධනයක් සිදුවිය යුතුය. එහෙයින් පාසල් පුස්තකාලයාධිපති ඉගෙණුම් කළමනාකරු වශයෙන් අවශ්‍ය භූමිකා රංගනයක නිරතවීම අත්‍යවශ්‍යය. ඒ සඳහා පුස්තකාල ප්‍රලේඛන සේවා සහ විඥාපන පාඨමාලා අන්තර්ගතය නවීකරණය කළයුතුය.

අද සිසු පරපුර මුහුණපා ඇති බරපතල දුෂ්කරතාවක් නම් කියවීම් කුසලතාවේ හීනතාවයයි. මෙහි ප්‍රති විපාකය ලෙස කියවීමෙන් ඈදහැලෙන දරුවෝ බොහෝවිට වෙනත් සරල වූත් විචිත්‍රවූත් නව මාධ්‍යවල ග්‍රහණයට පූර්ණ වශයෙන් හසුවෙති. ඔවුහූ දවසේ වැඩි වේලාවක් රූපවාහිනියේ ඇලී ගැලී සිටිනු දක්නට ලැබේ.

පාඨකයින්ගෙන් තොරව පුස්තකාලයක් තිබිය නොහැකිය. ඒ නිසා පුස්තකාලයට පාඨකයින් ගෙන්වා ගැනීමටත්, පුස්තකාල භාවිතයට ඔවුන් දිරිමත් කර වීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග දියත් කිරීම පුස්තකාලයේ කාර්යභාරයකි. මේ සඳහා ප්‍රදර්ශන, දේශන, තරඟ ආදී දිරිමත් කර වීමේ වැඩසටහන් උචිත පරිදි යොදාගත හැකිය.

පුස්තකාලයාධිපතිවරුන්ට මුහුණ දීමට සිදුවන ගැටලුවක් නම් විශේෂයෙන් ම වැඩිහිටි පාඨකයින් පුස්තකාලයාධිපතිවරුන්ගෙන් උපදෙස් හෝ මඟ පෙන්වීම් ලබා ගැනීමට පසුබට වීමයි. කුලෑටි බව, තමන් යමක් නොදන්නා බව වෙනත් අයෙකු දැනගැනීමට ඇති අකමැත්ත ඒ සඳහා හේතුකාරක විය හැකිය. එහෙත් අතිරේක ව්‍යාප්ති සේවාවන් තුළින් මහජන සම්බන්ධතා වර්ධනය කර ක්‍රියාශීලී පුස්තකාල සේවාවක් ලබා දිය යුතුව ඇත.

IFLA (International Fedaration of Library Associations) සංවිධානය විසින් පාසල් සහ මහජන පුස්තකාල සඳහා වෙන වෙනම ප්‍රඥප්ති සම්පාදනය කර ඇත්තේ විශේෂයෙන් ම සංවර්ධනය වන රටවල පාසල් පුස්තකාල සේවාවේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක වර්ධනයක් ඇති කරලීමේ අරමුණ පදනම් කර ගෙනය. මෙම ප්‍රඥප්තිවලින් අභාෂය ලබාගෙන රටවල් සඳහා ජාතික මට්ටමේ පාසල් ප්‍රඥප්ති සම්පාදනය කර ඇත. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පාසල් පුස්තකාල ප්‍රතිපත්තියක් දශක කිහිපයකට පෙර සම්පාදනය කර අනුමත කර ඇත. එම ප්‍රතිපත්තිය සක්‍රීයව ක්‍රියාකාරි මට්ටමකට ගෙන ඒම කාලීන අවශ්‍යතාවකි.

සාක්ෂරතාව ප්‍රාථමික අධ්‍යාපනයේ සිටම වර්ධනය කළ යුතු නිපුණතාවයකි. ප්‍රාථමික අධ්‍යාපනයේ මූලික අරමුණ වනුයේ කථනය, ගණනය සහ ලිවීම වර්ධනය කිරීමයි. එය ඉංග්‍රීසි භාෂාවෙන් 3R යනුවෙන් හැඳින් වේ.

| | | |
|---|---|---|
| **Reading** | - | **කථනය** |
| **Writing** | - | **ලිවීම** |
| **Arithmetics** | - | **ගණනය** |

පාසල් පුස්තකාලය තුළින් මෙම නිපුණතාවයන් වර්ධනයට අවශ්‍ය මූලික අඩිතාලම දැමීමට හැකි වාතාවරණයක් උදා කළ හැකිය. එය මනා ලෙස සකස් කරන ලද ඉගෙනුම් පරිසරයක් ලෙස හැඳින් වේ.

පාසල් ප්‍රජාවට පුස්තකාලය දැනුම ලබාදෙන මධ්‍යස්ථානයක් වුවත් එහි ප්‍රයෝජනය, පරිශීලනය කිරීම සීමා වී ඇත. ඒ සඳහා කරුණු කිහිපයක් බලපාන බව පෙන්වා දිය හැකිය.

- විෂයමාලාවේ බර වැඩිකම
- ඇගයීම් ක්‍රමවල පවත්නා අයහපත් ලක්ෂණ
- දැඩි තරඟකාරි විභාග ක්‍රම
- ගුරු බලවත්කරණය යටතේ දැනුම යාවත්කාලීන කිරීමට උත්සුක නොවීම
- පාසල් පුස්තකාලයේ සම්පත් හා උපකරණ හිඟකම
- ගුරු අධ්‍යාපන පාඨමාලාවල අන්තර්ගතයන් නවීකරණය නොවීම

- පුස්තකාල කාර්ය මණ්ඩලය අනධ්‍යයන කාර්ය මණ්ඩලයක් ලෙස සළකා සුළු සේවක පැමිණීමේ ලේඛනවල අත්සන් කිරීම
- ගුරු වෘත්තියට සමගාමී තනතුරු නාමයක් ලෙස නො සැලකීම
- පාසල් පුස්තකාලයාධිපතීන් කෙරෙහි සෘණ ආකල්පයක් පැවැතීම

මෙම කරුණු පිළිබඳව අවධානය යොමු කර ගුණාත්මක පාසල් පුස්තකාල සේවාවක් හඳුන්වාදීම මෙරටේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල කොටසක් බව අවධාරණය කළ හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ


උඩගම, ප්‍රේමදාස (2003), නිදහසින් පසු ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය, ඇගැයුම්, අභියෝග හා අපේක්ෂා, සාර ප්‍රකාශන, කොට්ටාව

ගුණවර්ධන, චන්ද්‍ර (1999), තුලනාත්මක අධ්‍යාපනය, දීපානි මුද්‍රණාලය, නුගේගොඩ

ගුණවර්ධන, බන්ධුල (2004), අධ්‍යාපන පර්යේෂණ, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම

චන්ද්‍රසේකර, එච්. එම්. (2010), ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ විකාශනය, ප්‍රදීප ප්‍රකාශන, කොළඹ

ජයවීර, ඒ. එම්. එස්. (1999), විෂයමාලාව සංවර්ධනයට ප්‍රවේශයක්, අර්ථකථනය, ඉතිහාසය ආකෘති යන විෂය නිර්දේශය, මහරගම

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව (1992), ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ පළමුවන වාර්තාව, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව, කොළඹ

පලිහක්කාර, කේ. එන්. (1991), පාසල් කළමනාකරණය, සිංහ මුද්‍රණාලය, මාතර



, Afro – Asian Book Council; හිටපු සහකාර අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය, බාහිර කථිකාචාර්ය, පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

# Digitization : Panacea for Preservation and Access in Libraries and Archives?

Dr. K.D.G. Wimalaratne


## *Introduction*

*The development of computer technology in the modern world has led librarians and archivists to go into new preservation, access and storage devices, as their collections are threatened with brittleness, acidity, excessive usage, and attack by various insects. The ultimate result of the above hazards leads to limited or total stoppage of access to scholars and readers which is a vital function of an librarian or an archivist.*

*At present, librarians and archivists are searching for an alternate medium for depositing, and retrieving information in books and documents. They have already by – passed microfilming or microforms as a deposit, preservation and retrieval medium and shifted to digitization, using computer hardware, such as CDs and DVD's. The question comes up whether digitization or computer digitization or computerizing books and documents is a viable alternative for microfilming or preserving original books and documents in libraries and archives.*



## *Keywords :*

*Digitization, scanning, computer imaging*


## What is digitization?

**S**imply it means, the transfer of records or information into electronic form or the conversion of characters or images into binary digits.

## Advantages of digitization

Document imaging processing systems allow for the conversion of materials from paper or other form to machine readable form, which allows them to be stored and viewed electronically, saving space and

g) To ensure that the pages are in order with any illustrations. If the pagination is not clear, repaginate after setting the pages.

h) Any first aid work to be completed before sending for digitization.

i) Any flags, book marks, clips etc… to be removed in pages.

j) Any pencil or other marks made by a reader should not be erased.

## Preparation of documents

a) Documents to be selected on a priority basis, according to the importance, rarity; historicity, condition of conservation, eg; corrosion of ink or brittleness.

b) If the documents are in loose - leaf, prepare in a chronological or document subject/series or combination of both.

c) If the documents are filed in file form, to check whether the pages are correctly paginated and in order.

d) If the file covers are missing, new file covers with the original Information to be included.

e) To remove any clips or pins in files.

f) To remove any dust or dirt on the documents

g) It is advisable to commence the scanning according to divisions of the Institution unless another criteria is selected by the policy makers in charge of the programme.

### Scanning and scanners

a) Scanning officer/s to be fully trained in the operation of the scanning machine.

b) A separate unit to be set up for scanning.

c) The unit should be staffed with the following officers

i. Officer in charge of the unit with a IT knowledge
ii. Supervising officer
iii. Assistant


ATIZ

a. A flatbed scanner, copying books face up is ideal. The bed of the scanner could be $A_3$ size. However, if there are outsize books, maps and plans in the library, $A_2$ Bed scanner is sufficient.

If the library has a newspaper collection $A_1$ Bed scanner to be used. $A_0$ bed scanners are available for all size books and documents, However, they are expensive.

The scanner should have a cradle to copy books or documents bound together with a heavy spine – Otherwise the text close to the bound spine will not be properly scanned. Do not unbind books and documents for scanning.

There are versatile hand scanners which could be used for in-house purposes and for small orders. However, they are not good for heavy, day to day scanning, as they get heated up in no time.

## Guidelines for scanning

i) Before commencing of scanning of a book or document the following statement to be scanned as the prelude (vide appendix 1)

ii) At the end of scanning a book or a document, insert the following statement at the end of the last page scanned of the book document (vide appendix 2)

iii) At the end of a file series/ category sub-series, insert the following statement at the end of the last file/ document (vide appendix 3)

iv) When commencing a new file series or category/similar title files, insert the following statement, (vide appendix 4)

v) After scanning, at the end of the ‘‘compact disc’’ insert the following statement (vide appendix 5)

vi) At the end of a compact disc the following certification to be included by the supervising/ certifying officer (vide appendix 6)

thoroughly recorded years in the history of, mankind ended up among the least well preserved.

### *References*

A new age: electronic Information systems, State Governments and the preservation of the Archival record, (1991), USA, 1-08 p.

Automating Record Services, International Records Management Trust, (Lo), /Digitization, (1991), 115-123 p.

Avedon, Don. M. (1994), Introduction to Electronic Imaging, (2nd Edition), U.S.A, 1- 56 p.

Chain, Piers and Millar, Laura, the Implications of electronic records, paper read (n.d),19 p.

Commission on preservation and access (Report)(1991), USA, 1-40 p.

Cook, Terry (1996), Keeping our electronic memory approaches for securing computer generated record, address to British Government senior establishment officers, P.R.O. (London), 1 -15 p.

Preserving Records, (1999), International Records Management Trust, London, Digitization, 129-132 p.

Wimalaratne, K. D. G. (2003), Record and information Managers in the electronic Age, paper read, Colombo, 1-05 p.

Wimalaratne, K.D.G. (2013), Challenges faced by Archivists and Record Managements in the management of electronic records of public institutions(paper read at the SAARC Archives conference , Colombo, 1-7 p.

Wimalaratne, K.D.G. The Challenges & Possible solutions in records/ archives Management conservation in the next millennium with special reference to electronic records, Paper Read, 1-8 p.

## Appendix V

Division/Branch ……………………………
End of CD/CD ROM/other ……………………………..
Continued in CD/CD Rom/other ……………………………..

## Appendix VI

Certification of scanning to CD/CD ROM/other

I hereby certify that the scanning of files/Records/Books/ Photographs/ in this electronic format (eg. CD – DVD,CD ROM (No: ) was carried out under my supervision, according to the norms and standards of digitization, accurately, also keeping with the originality and integrity of the original Book. File. Record/Photograph, to be accepted in a court of law.

Certifying officer (Name) : ……………………………………….
Signature : ……………………………………….
Date : ……………………………………….
Place of Certification : …………………………………......
Seal of the officer certifying : ……………………………………….


## K. D. G. Wimalaratne



B. A. (Hons) Ceylon, Postgraduate Diploma, University of Padua, Italy, Ph. D Academy of Sciences, Philadelphia; Visiting Lecturer, University of Kelaniya; Former Director, Department of National Archives, Sri Lanka

ස්ථානයකි. මහජන පුස්තකාලය යනු ජනතාවට අධ්‍යාපනික, සංස්කෘතික හා විනෝදාත්මක තොරතුරු සපයන බහුවිධ පරමාර්ථ සහිත ආයතනයකි. එය පළාත්, ප්‍රාදේශීය පාලන ආයතන හෝ මධ්‍යම රජය මගින් ක්‍රියාත්මක වන ආයතනයකි. එය ජනතාවගේ ජනවර්ගය, ජාතිය, වයස, ස්ත්‍රී පුරුෂ භාවය, ආගම, භාෂාව, ආර්ථික තත්වය, රැකියා තත්වය, අධ්‍යාපනික පසුබිම ආදී කරුණු සැලකිල්ලට නො ගෙන සියලු දෙනාට සමානව තොරතුරු හා දැනුම සඳහා ප්‍රවේශය ලබාදීමට කටයුතු කරයි. යුනෙස්කෝ මහජන පුස්තකාල ප්‍රතිපත්ති ප්‍රකාශයට (UNESCO Public Library Manifesto)අනුව මහජන පුස්තකාල සේවාවන් නොමිලයේ ලබා දිය යුතුය. මහජන පුස්තකාල සේවාවන් ලබාදීම පළාත් හා ජාතික ආණ්ඩුවල වගකීමකි. නීතිරීති මගින් මේ සඳහා සහාය ලබාදිය යුතු අතර පළාත් හා ජාතික ආණ්ඩු මගින් මූල්‍ය ප්‍රතිපාදන ලබාදිය යුතුය. සංස්කෘතික තොරතුරු සැපයීම, සාක්ෂරතාවය හා අධ්‍යාපනය සඳහා වන දිගු කාලීන උපායමාර්ග සැකසීමේ දී මහජන පුස්තකාල සේවය අත්‍යාවශ්‍ය අංගයක් විය යුතුය. මෙම ප්‍රතිපත්ති ප්‍රකාශනය මගින් මහජන පුස්තකාලය දැනුම් දොරටුවක් වශයෙන් හඳුන්වා ඇත. නිදහස, සෞභාග්‍ය හා සංවර්ධනය මූලික මිනිස් අයිතීන් වේ. දැනුම කරා යාමේ ප්‍රාදේශීය දොරටුවක් වන මහජන පුස්තකාලය මගින් පුද්ගලයාට හා සමාජ කණ්ඩායම්වලට පූර්ණකාලීන ඉගෙනීමේ හැකියාව, ස්වාධීන තීරණ ගැනීමේ අවස්ථා හා සංස්කෘතික ප්‍රගමනය සඳහා අවශ්‍ය පහසුකම් සලසා දේ. කිසියම් හේතුවක් නිසා මහජන පුස්තකාලවල සාමාන්‍ය සේවාවන් ලබාගත නොහැකි පිරිස්වලට එනම් විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්, රෝහල්ගත රෝගීන්, සිරකරුවන් වැනි අයට ද විශේෂිත සේවාවන් මහජන පුස්තකාලය විසින් ලබා දිය යුතුය. එමෙන් ම මෙම ප්‍රතිපත්ති ප්‍රකාශනය සඳහන් කරන ආකාරයට ජාතික මට්ටමේ පුස්තකාල සහයෝගීතාවයක් හා සම්බන්ධීකරණයක් ඇති කිරීම සඳහා ව්‍යවස්ථා හා උපාය මාර්ගික සැලසුම් සකස් කළ යුතුය. මහජන පුස්තකාලය ප්‍රාදේශීය, කලාපීය, ජාතික මෙන් ම ජාත්‍යන්තර මට්ටමේ ද පාඨක සමූහ හා වෙනත් වෘත්තිකයින් සමඟ සහයෝගය ඇති කරගත යුතුය.

ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල සේවයේ ඉතිහාසය 19 වන සියවසේ මුල් භාගය පමණ දක්වා ඈතට දිවයයි. බ්‍රිතාන්‍ය පාලන සමයේ දී ලංකාවේ

පුස්තකාල සේවාවන් සංවිධානය කිරීමේ හොඳම පදනම ව්‍යවස්ථා හඳුන්වාදීම බව දියුණු යයි සම්මත රටවල් පවා හඳුනා ගෙන ඇත. (Venkatappaiah, 1994) ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල සේවාවේ පසුගාමීත්වයට ප්‍රධාන හේතුව මහජන පුස්තකාල පරිපාලනය සඳහා විධිමත් ආයතනික ව්‍යුහයක් නොතිබීමයි. දැනට මහජන පුස්තකාල පාලනය වන්නේ පළාත් පාලන ආයතනවල දේශපාලන බල අධිකාරිත්වය යටතේ ය. එබැවින් මහජන පුස්තකාල පරිපාලනය සඳහා නව පනතක් සම්පාදනය කර මහජන පුස්තකාල පරිපාලනය සඳහා නීතිමය පදනමක් ලබාදිය යුතුය. මෙවැනි පනතක් මගින් මහජන පුස්තකාල පරිපාලනය සඳහා ජාතික ආයතනයක් පිහිටුවිය හැකි අතර පළාත් මට්ටමින් ආයතන පිහිටුවිය හැකිය. මහජන පුස්තකාල සංවර්ධනය සඳහා සැලසුම් සකස් කිරීම, ප්‍රතිපත්ති සම්පාදනය, මුදල් ප්‍රතිපාදන ලබාදීම, කාර්යමණ්ඩල සංවර්ධනය, ප්‍රගති සමාලෝචනය ආදී කටයුතු මෙම ආයතන මගින් ඉටුකළ හැකිය. මෙම ආයතනවල ප්‍රධානීන් වශයෙන් සුදුසුකම් ලත් පුස්තකාල වෘත්තිකයින් පත් කළ හැකිය. එමෙන් ම මහජන පුස්තකාලවල කාර්යභාරය නවීන ලෝකයට ගැලපෙන ආකාරයට නවීකරණය කිරීම ද මෙම ආයතන මගින් කළ හැකිය. මේ තුළින් ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල පද්ධතියේ සංවර්ධනාත්මක පරිවර්තනයක් කළ හැකි ය. සෑම රටකට ම පුස්තකාල ව්‍යවස්ථා අවශ්‍ය වීමට ප්‍රධාන හේතු පහත පරිදි දැක්විය හැකිය.

1) මනා පුස්තකාල සේවාවක් සඳහා යහපත් මූල්‍ය ප්‍රතිපාදන ලබාගැනීම
2) ශක්තිමත් අධිකාරි බලයක් ගොඩනැගීම
3) මහජන පුස්තකාල පද්ධතිය සඳහා ඒකීය බවකින් යුත් ක්‍රමානුකූල හා ඒකාබද්ධ වූ සංවර්ධනයක් ලබා ගැනීම
4) වඩා යෝග්‍ය හා ප්‍රමාණවත් සුදුසුකම් ලත් පුස්තකාල වෘත්තිකයින් ලබා ගැනීම
5) මහජන පුස්තකාල පද්ධතිය සඳහා පුළුල් ආයතනික ව්‍යුහයක් හඳුන්වා දීම
6) පුස්තකාල වෘත්තිකයන් සඳහා සේවා තත්වයක් ලබා ගැනීම

ලෝකයේ බොහෝ රටවල් දැනට මහජන පුස්තකාල ව්‍යවස්ථා හඳුන්වා දී ඇත. එක්සත් රාජධානියේ මහජන පුස්තකාල නීතිරීතිවල ආරම්භය 1840 දක්වා ඈතට දිවයයි. එක්සත් රාජධානියේ මහජන පුස්තකාල පද්ධතිය

කළ හෙතෙම එම සමුළුවට ඉන්දියාව සඳහා ආදර්ශ පුස්තකාල පනතක් ඉදිරිපත් කරන ලදී. මෙම ආදර්ශ පනත සමුළුවේ දී දීර්ඝ වශයෙන් සාකච්ඡාවට භාජනය විය. එමෙන් ම ඔහු ඉන්දියාව සඳහා පුස්තකාල සැලසුම් දෙකක් සකස් කරන ලදී. එනම් පශ්චාත් යුධ පුස්තකාල ප්‍රතිසංසකරණ සැලැස්ම (1944) හා ජාතික පුස්තකාල පද්ධතිය පිළිබඳ සැලැස්ම (1946) යන සැලසුම් දෙකයි. 1948 දි ජාතික මධ්‍යම පුස්තකාල කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් ආචාර්ය රංගනාදන් මහතා පත් කරන ලදී. රංගනාදන් මහතා විසින් මධ්‍යම රජය සඳහා සකස් කළ පුස්කතාල කෙටුම්පත හා ජාතික මධ්‍යම පුස්තකාලය සඳහා සකස් කළ සංවර්ධන සැලැස්ම කමිටුව අනුමත කරන ලදී.

මැලේසියාවේ සෑම ප්‍රාන්තයකම මහජන පුස්තකාල සේවාවන් ක්‍රියාත්මක වේ. සෑම ප්‍රන්තයක් සඳහා ම මහජන පුස්තකාල නීතිරීති සම්පාදනය කර ඇත. ඇමෙරිකා එක්සත් ජනපදයේ ද ප්‍රාන්ත මට්ටමින් මහජන පුස්තකාල ව්‍යවස්ථා ක්‍රියාත්මක වේ. චීනයේ මහජන පුස්තකාල ව්‍යවස්ථා සම්පාදනය ආරම්භ වූයේ 2008 වර්ෂයේ දී ය. චීනයේ මහජන පුස්තකාල ව්‍යවස්ථා සම්පාදනයේ දී මතු වූ ගැටලුවක් වූයේ චීනයේ මහජන පුස්තකාල නීතිරීති සකස් කළ යුත්තේ නීතියක් වශයෙන් ද පනතක් වශයෙන් ද යන්න හා එම නීතිරීති මගින් චීන ජාතික පුස්තකාලය ද ආවරණය විය යුතු ද යන්නයි. ස්වීඩනයේ මහජන පුස්තකාල ව්‍යවස්ථා හඳුන්වා දෙන ලද්දේ 1996 වර්ෂයේ දීය. නවසීලන්තයේ මහජන පුස්තකාල ව්‍යවස්ථා පිළිබඳ වැදගත් සංධිස්ථානයක් වන්නේ එඩ්වඩ් වේක් ෆීල්ඩ් මහතා (Edward Wake Field) 1877 දී මහජන පුස්තකාල කෙටුම්පත හඳුන්වාදීමයි. ජෝර්ජ් මොරිස් මහතා විසින් 1869 දී මහජන පුස්තකාල කෙටුම්පතක් පාර්ලිමේන්තුවට හඳුන්වා දෙන ලදී. ඕස්ට්‍රේලියාව ද පුස්තකාල ව්‍යවස්ථා පුළුල් වශයෙන් ක්‍රියාත්මක වන රටකි. පුස්තකාල අණපනත් විශාල සංඛ්‍යාවක් මේ යටතේ හඳුන්වා දී ඇත. තායිලන්තයේ මහජන පුස්තකාල රෙගුලාසි හඳුන්වා දෙන ලද්දේ 1949 වර්ෂයේ දීය. 1973 දී මහජන පුස්තකාල පරිපාලනය අධ්‍යාපන පරිපාලන දෙපාර්තමේන්තුව යටතට පත් කරන ලදී. තායිලන්තයේ මහජන පුස්තකාල කුඩා, මධ්‍යම හා විශාල වශයෙන් වර්ග තුනකට වර්ගීකරණය කර ඇත. තායිලන්තයේ ද මහජන පුස්තකාල ප්‍රමිති හඳුන්වා දී ඇත. ඉන්දුනිසියාවේ මහජන පුස්තකාල

7) මහජන පුස්තකාල හා වෙනත් පුස්තකාල සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන ලබා දීම
8) පුස්තකාල සංවර්ධනය හා පවත්වාගෙන යාම සඳහා මූල්‍ය ආධාර යෝජනා ක්‍රමයක් මගින් ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන ලබා ගැනීම
9) පුස්තකාලයාධිපති සේවය ප්‍රතිසංවිධානය කිරීම
10) ගුණාත්මක අවශ්‍යතා සඳහා ගැලපෙන පරිදි බඳවා ගැනීමේ පරිපාටි නැවත සකස් කිරීම
11) පුස්තකාල පුහුණුව සඳහා ක්‍රමානූකූල හා අඛණ්ඩ වැඩසටහන් හඳුන්වා දීම
12) පළාත් පාලන පුස්තකාල හා පාසල් පුස්තකාල අතර සමීප සබඳතාවයක් පවත්වාගෙන යාම
13) පළාත් පාලන පුස්තකාල සඳහා නව තාක්ෂණය උපයෝගී කර ගැනීම සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීම සඳහා පළාත් පාලනය පිළිබඳ ජාතික සභාවට අනුබද්ධිතව කමිටු පත් කිරිම

ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල ක්ෂේත්‍රයේ වත්මන් පසුගාමීත්වයට ප්‍රධාන හේතුව වශයෙන් පහත සඳහන් තත්වයන් හඳුනාගත හැකිය.

1) මහජන පුස්තකාල ව්‍යවස්ථා (public library legislation) හඳුන්වා නො දීම
2) මහජන පුස්තකාල පද්ධතිය දේශපාලන බලධාරීන් යටතේ ක්‍රියාත්මක වීම
3) මහජන පුස්තකාල පාලනය කිරීම සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයට බලයක් නො තිබීම

ලෝකයේ බොහෝ රටවල මෙන් ම ශ්‍රී ලංකාවේ ද වැඩිම පාඨක පිරිසක් භාවිත කරනුයේ මහජන පුස්තකාල සේවාවයි. එබැවින් මහජන පුස්තකාල සේවය ප්‍රතිපත්ති රෙගුලාසි හා නීතිරීති මගින් පාලනය විය යුතුය. මහජන පුස්තකාල ව්‍යවස්ථා පිළිබඳ මාර්ගෝපදේශ යුනෙස්කෝ ආයතනය විසින් සකස් කර ඇත. යුනෙස්කෝ ආයතනය වෙනුවෙන් මෙම මාර්ගෝපදේශ සකස් කරන ලද්දේ පිලිප් සෙවල් (Philip Sewell) ඒ. ඩබ්ලිව්. මැබ්ස් (A.W Mabbs) සහ ඊ.එම්. බ්රූම් (E.M. Broome) යන මහත්වරු විසිනි.

කරන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවේ. බොහෝ ග්‍රාමීය මහජන පුස්තකාල සඳහා යෝග්‍ය ගොඩනැගිලි පහසුකම් නොමැත. උසස්වීම හා පුහුණු අවස්ථා නොමැතිවීම, තොරතුරු තාක්ෂණය උපයෝගී කරගැනීමේ දී පවතින පසුගාමී බව වැනි වෘත්තීය ගැටලුවලින් බොහෝ මහජන පුස්තකාලයාධිපතිවරු පීඩා විඳිති. දැනට මහජන පුස්තකාලවලට අදාළව අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක වේ. මහජන පුස්තකාල ක්‍රියාත්මක වියයුතු ආකාරය පිළිබඳව මාර්ගෝපදේශ මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් වේ. මහජන පුස්තකාලවල තිබිය යුතු අංශ, සේවා, උපදේශක කමිටු හා ඒවායේ සංයුතිය සාමාජිකත්ව ක්‍රමවේදය හා පුස්තකාලයේ පරිපාලනයට අදාළ අනෙකුත් නීතිරීති මෙම අතුරු ව්‍යවස්ථාවල අන්තර්ගත වේ.

## ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ කාර්ය භාරය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මීට වසර 28 කට පමණ පෙර එනම් 1986 දී ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල ව්‍යවස්ථා හඳුන්වාදීම සඳහා උත්සාහයක යෙදිණි. ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල සේවාවේ පැවති දුර්වලතා ඉවත් කිරීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ විය. මහජන පුස්තකාල ව්‍යවස්ථා සම්පාදනය සඳහා 1986 දී විශේෂ කමිටුවක් පත් කරන ලදී. මෙම කමිටු වාර්තාවෙන් ඉදිරිපත් කර තිබූ ප්‍රධාන යෝජනා පහත සඳහන් පරිදි වේ.

1) මහජන පුස්තකාල සේවාව පළාත් පාලන සේවාවේ අත්‍යවශ්‍ය සේවාවක් ලෙස සැලකීම
2) මහජන පුස්තකාලවල අභිවෘද්ධිය සඳහා කටයුතු කිරීමට පළාත් පාලන දෙපාර්තමේන්තුව සම්බන්ධකොට මහජන පුස්තකාල ඒකකයක් පිහිටු වීම
3) සෑම වර්ගයකම පළාත් පාලන ආයතන සම්බන්ධ කොට මහජන පුස්තකාල කමිටු පිහිටුවීම
4) මහජන පුස්තකාල සඳහා ස්ථිර ලෙස වාර්ෂික මුදල් ප්‍රතිපාදන ලබා දීම
5) මහජන පුස්තකාල සඳහා වැයවන ප්‍රාග්ධන වියදම්වලින් 50%ක් මධ්‍යම රජය මගින් දැරීම
6) මහජන පුස්තකාල සඳහා ප්‍රමිතීන් හඳුන්වා දීම

1990 වර්ෂයේ දී ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය පළාත් සභා පුස්තකාල සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතිය මගින් පළාත් මට්ටමින් පුස්තකාල සංවර්ධනය කිරීමට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය බලාපොරොත්තු විය. මෙම ව්‍යාපෘතිය යටතේ සෑම පළාතකම පළාත් පුස්තකාල සේවා මණ්ඩලයක් හා පළාත් මධ්‍ය පුස්තකාලයක් පිහිටුවීමට සැලසුම් කෙරිණි. මෙහි පළමු පියවර වශයෙන් සෑම පළාතක් සඳහා ම පුස්තකාල ප්‍රඥප්ති සකස් කරන ලදී. පළාත් පුස්තකාල සේවා මණ්ඩලවල කාර්ය මණ්ඩලවල සංයුතිය සහ අනෙකුත් අදාළ කරුණු මෙම ප්‍රඥප්තිවල ඇතුළත් විය. කෙසේ වුව ද මෙම ව්‍යාපෘතිය දැනට ක්‍රියාත්මක වන්නේ පළාත් තුනක පමණි. දැනට ඌව මධ්‍යම හා උතුරුමැද පළාත්වල පළාත් පුස්තකාල සේවා මණ්ඩල පිහිටුවා ඇත. මෙම පළාත්වල සාර්ථකව පුස්තකාල සංවර්ධන කටයුතු දැනට ක්‍රියාත්මක වේ. සබරගමුව පළාතේ ද මෙම ව්‍යාපෘතිය තරමක් දුරට ක්‍රියාත්මක වී ඇත. සබරගමුව පළාතේ පළාත් පුස්තකාල සේවා මණ්ඩලය හා පළාත් මධ්‍ය පුස්තකාලය සඳහා ගොඩනැගිල්ලක් ද ඉදි කර ඇත. පළාත් පුස්තකාල ප්‍රඥප්තිය ගැසට් පත්‍රයේ පළ කර ඇත. මෙම ව්‍යාපෘතිය අනෙකුත් පළාත්වල සාර්ථකව ක්‍රියාත්මක නොවීය. මෙම පළාත් සභා පුස්තකාල සංවර්ධන ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ පුස්තකාල නීතිරීති හඳුන්වාදීමේ මූලික පියවරක් ලෙස හැඳින්විය හැකිය.

ශ්‍රී ලංකාවේ ද මහජන පුස්තකාල පනතක් සකස් කිරීමට අදාළ බලධාරීන් පියවර ගැනීම අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයත්, ශ්‍රී ලංකා පුස්තකාල සංගමයත් ආරම්භක පියවර ගැනීම කළ යුතුය. මහජන පුස්තකාල පනතක් මගින් ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල පද්ධතිය සඳහා නව පරිපාලන ව්‍යුහයක් ස්ථාපිත කළ හැකිය. මෙවැනි පනතක් මගින් මහජන පුස්තකාල පරිපාලනය මධ්‍යම රජයේ සෘජු පාලනය යටතේ පළාත් මට්ටමින් විමධ්‍යගත කළ හැකිය. නව පනත යටතේ මහජන පුස්තකාල පරිපාලනය, ප්‍රතිපත්ති සැලසුම් කිරීම, ප්‍රගති සමාලෝචනය වැනි කටයුතු සුදුසුකම් ලත් පුස්තකාල වෘත්තිකයින් මගින් සිදු කළ හැකිය. වත්මන් ක්‍රමය අනුව මහජන පුස්තකාල පද්ධති පරිපාලනය සිදු කරනු ලබන්නේ වෘත්තීය නොවන නිලධාරීන් විසිනි. මෙම හේතුව නිසා වෘත්තීය නොවන නිලධාරීන් හා මහජන පුස්තකාලයාධිපතිවරුන් අතර පරිපාලනමය ගැටීම් ඇති වේ. සමහර

Phiman, Anil Kumar, Gupta Sushima (2002), Library Legislation : need and importance of uttaranchal state, Indian Journal of Information and Library Science Vol. 15 No. 1-2

Piyadasa, T.G. (1985), Libraries in Sri Lanka ; Their origin and History from ancient times to present time, New Delhi, Sri Sathguru Publications

Venkatappaiah, Velaga (1994), Model Library Legislation, New Delhi : Concept Publishing Company



## ජී. ඩී. අමරසිරි

ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, කොළඹ විශ්වවිද්‍යාලය, අධ්‍යක්ෂ, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

National Library of Sri Lanka as the apex library in the country. (Amarasiri, 2000: i) Although legal provision was there in this Act, it has been observed by the CNLSB authorities that the said provisions were inadequate for the proper functioning of the National Library. Therefore, the National Library and Documentation Services Board Act, No 51 of 1998 was enacted by the Parliament in formally creating the twin institutions : the National Library and Documentation Services Board (NLDSB) and the National Library and Documentation Centre (NLDC). This Act provided the legal foundation for the National Library (NL) to act as a separate entity. (Amarasiri, 2000: ii) At the same time, the NLDSB became the parent organization of the NLDC.

When we examine the locally published literature pertaining to the role and functions of the NLDSB and NLDC, a number of contributions could be found. Somadasa (1975) has quoted the Final Report of the Special Committee on Antiquities – Sessional Paper VII – 1959, which states as follows: "The terms of reference of this Committee relate to antiquities and to museums. In such circumstances speak of libraries might appear a digression, but majority of witnesses who appeared before the Committee were unanimous that the Museum Library is an excellent nucleus for a Central National Library". This statement is a clear testimony to the need for formation of a coordinated national library system combining the libraries suitable for participating in such a venture. Somadasa also mentions in the same paper that the Salaries and Cadre Commission (Wilmot Perera Report – Sessional Paper VI-1961), Kandiah Committee report and the report submitted by Harold V. Bonny, a UNESCO adviser to Ceylon in 1961 have all expressed same views.

Warnasuriya (1975) has discussed the developments associated with the enactment of the Ceylon National Library Services Board Act, No 17 of 1970, the provisions made therein and the initial role played by the CNLSB.

As per the information published in the homepage of the National Library and Documentation Centre website, its role is stated as follows: "The National Library is mainly a Research and a Reference library and it is technically a library of last resort. It intends to provide library resources as well as information to all Sri Lankans through the National Library, library networks, information centres and resource centres". (NLDC,2014). As per the brochures published by the NLDC, its collection comprises of over 500,000 volumes which includes the 'Martin Wickramasinghe Collection' and a number of other special collections possessed by university academia etc. Seating capacity of the library, auditorium and the conference room is 320, 120 and 30 respectively. Services offered by the NLDC, as published in the website and the brochures are as follows:

- Reference service
- Referral service
- Documentation services
- Bibliographic and documentation services
    - Sri Lanka National Bibliography (Current and Retrospective)
    - Bibliography of Government Publications
    - ISBN Directory
    - Directory of Social Science Libraries, Information Centres and Databases
    - Sri Lanka Conference Index
    - Sri Lanka Newspaper Index
    - Index to Periodical Articles published in Sri Lanka
    - National Union Catalogue
    - Index to Postgraduate Theses
- Internet services
- Access to Databases
- Inter-library loan service

Photocopy service
- User education service
- Enquiry service (NLDC, 2014; NLDC, 200?)

In 2015, the NLDC will commemorate its silver jubilee. As such, it is very much appropriate in identifying the challenges looming ahead of the future path of the twin institutions and to discuss possible future directions to counter adverse factors. The following discussion is presented mainly based on the experiences and insights gained through the interactions the author had with these institutions during the last four decades along with the facts reported in LIS literature. Such experiences are viewed through the observable trends visible in the LIS profession. Therefore, views expressed here reflects authors visualizations based on published LIS literature and has no relationship to official views of the NLDSB and NLDC.

In presenting a paper on “National libraries: where next?” Green has observed that it is not an exaggeration to state that most national libraries with long histories have witnessed more fundamental changes in the last ten to twenty years than they have in any other period of their development. (Green, 2008?). In this paper he describes that the national library audience has changed from a limited population of academics and researchers to all citizenry, during the period of last two decades. He has also mentioned that national libraries have started to create online national library collections and services many of which are freely available to a wider audience than the traditional physical audience. Another significant aspect mentioned here is that the present generation of users’ preference to access information from the digital environment of their homes.

Hunter and Brown have identified “a small number of influences which may have a significant impact on national libraries of ‘small, smart countries’ in the future” as follows : Changing patterns of publishing , Changing patterns of customer needs and behaviours , Competition ,

Political influences ,and Organizational change. Issues such as the shift to digital publishing, availability of mobile communication technology, emergence of new business models such as open access to scholarly sources, use of social collaborative tools such as web 2.0, mass digitization of materials, electronic legal deposit etc. are discussed in this report. (Hunter and Brown, 2010)

In discussing the future of bibliographic control and the new role to be played by the Library of Congress, the Library of Congress Working Group states that future bibliographic control will be collaborative, decentralized, international in scope, and web-based. It emphasizes the need for more efficient and cooperative approach with the aim of minimizing the costs associated with such tasks. Another important area for action includes the need to expose the unique materials held by libraries that are currently hidden from the view, to use the World Wide Web as the main platform, to make available bibliographic data not only for readers, but also for machine applications, and strengthening the library profession through education and the developments that will inform decision-making, now and in the future. (Library of Congress, 2008: 1-2)

Quoting Crowford, Shafique mentioned that libraries bridge the past, the present and the future using a mix of media, resources and technology to preserve the cultural history and provide the information, knowledge and enlightenment that people need now and will need in the future (Shafique, 2007). In addition to the above mentioned literature, the author scanned web sites of SAARC national libraries and observed that there is a great variety in the provision of their services. The following discussion is presented in the context of local conditions and constraints applicable in case of NLDSB and NLDC.

which includes the Salaries and Cadre Committee of the government to get special status for NLDSB/NLDC professional staff, this matter is still not resolved. As a planning organization which is entrusted with the coordination and development of the whole national library service, formulating policies , developing standards , and acting as the pinnacle of the library system of the country and to provide professional leadership, it is absolutely essential to occupy the top positions of the NLDSB and NLDC by senior and qualified LIS /ICT professionals. A staff structure with a proper blend in senior, mid-career and junior staff positions will facilitate the NLDSB and NLDC to foresee the future, make strategic plans and to transform such plans into reality.

Another significant factor is the need for continuous re-training of staff to make them ready to accept new challenges mostly associated with the sphere of ICT. As the information world is moving towards virtual environment, special attention must be made to develop the ICT competent staff in relevant specialies and in sufficient number. To retain specialist professionals within the organization, all stakeholders have to work together to improve remuneration benefits. Looking from a historical perspective, development of the human capital appears to be a daunting task.

- **Arrival of a 'Google Generation'**

With the widespread use of Internet for information dissemination and searching, users are more inclined to use Internet search engines such as Google to locate information. In a project report published by the University College, London reference is made to a notion of 'Google generation'. They are also referred-to as 'Screeagers', 'digital natives', 'Generation Y' also in web documents describing their information seeking behavior. It was reported here that people belonging to so called Google generation may try to rely on online

and efficient than typical library opacs and web-opacs. It is our experience that Google takes nanoseconds to search huge databases and we are aware that even if we misspell words, it autocorrects and presents possible answers. In yet another area, sites such as Amazon presents the bestseller ranks of documents based on previous use of their databases and presents customer reviews about the selected publications. In the face of all these practices and developments, libraries could not function as 'static units' and need to explore what lies ahead and to promote dialogue among stakeholders and to develop suitable mechanisms. Therefore, survival in a rapidly changing information environment also could be identified as a major challenge.

- **Declining trends in reading habit**

The whole profession of librarianship is dependent on one primary factor of human behavior – namely the reading habit. Insights into the way the users made use of recorded knowledge show that the practices prevalent in the society prior to the widespread use of photocopying, which was started in the country around late seventies were very much conducive for the nurture of reading habit. Notes had to be taken or complete copying of texts had to be done manually, which required reading. This has two fold benefits in leaving in memory of some portion of the texts and to improve one's own vocabulary. With the advent of photocopying, need for the immediate reading of complete sections was made redundant. Besides, the perception that a user has a personal copy may drive away the urgency to read the concerned text.

## 3. Suggestions for Future Course of Actions

The following discussion is based upon the primary assumption that the NLDSB and NLDC could develop its professional staff to a satisfactory level both in terms of the number and the 'blend of talents' referred-to earlier in this paper.

### ♦ Development of the human capital

It is the primary responsibility of all authorities concerned to take necessary steps to develop the human capital within the twin institutions. In order to attract suitably qualified professionals and to retain for long periods, steps have to be taken to introduce remuneration benefits comparable to similar institutions in the country, such as universities. Action has also to be taken to impart in-depth knowledge and skills in certain aspects such as the compilation of the national bibliography, organization of mobile-enabled services etc. Postings in suitable local and foreign institutions such as the British National Library would enable respective professionals to get exposure and to share experiences. As an interim measure, NLDSB / NLDC could create visitorship / fellowship / senior researcher positions to attract experienced LIS / ICT professionals from universities and other institutions on temporary / contractual / assignment basis. However, it is necessary to identify the missions of such assignments and the tasks to be completed within a stipulated period. In order to make this proposal a reality, such plans should be incorporated into the strategic plans / corporate plans of the NLDSB / NLDC and approval of concerned authorities and allocation of funds have to be obtained. Apart from providing a short term solution for the issue , it would also enable the transferring of skills to NLDSB / NLDC staff and adopt best practices followed in other institutions.

In strengthening the resource collection held in the NLDC, other similar institutions have to be linked with the NLDC as a network. The Museum Library, Department of Government Archives, National Science Foundation are some such institutions suitable for linking.

One of the major constraints in establishing and maintaining library networks is the lack of funding earmarked for such purposes. In order to maintain a secretariat and man such centers and to conduct meetings, training programmes etc. capital infusion is needed. Therefore, plans should include the proposed budget and such plans have to be reflected in the NLDSB / NLDC strategic / corporate plan. Alternatively, funds could be sought from private sector institutions under the theme of 'corporate social responsibility'.

The formation of networks enables the sharing of scarce information resources and to identify the strengths and weaknesses of participating libraries. In order to ensure the assistance from resource rich libraries to resource poor libraries 'twinning of libraries' could also be implemented. Modern communication platforms such as Facebook, Twitter, Flickr, etc. could be used to communicate with all stakeholders.

- **Communicating value**

In a recent research report published by the American Association of College and Research Libraries (ACRL) , it was emphasized about the need to communicate and prove the value of services provided by American academic libraries towards the academic enterprise. (ACRL, 2012). This situation is common to all types of libraries. As the society is moving with a more commercial orientation, allocation of resources will be preceded by questioning the value of the institution's output. This condition may not be applicable in case of mainline essential services such as education, health, transport, power sectors etc.

experienced professionals attached to university, special, school and public libraries. Infrastructural facilities, secretarial services and financial provision etc. have to be provided by the NLDSB / NLDC.

- **Provision of National Bibliographic Services**

Provision of bibliographic services could be identified as a major thrust area for the NLDC to achieve the identity of important and vital government institution. In this aspect, it is worthy of considering the statistics pertaining to book publishing industry in the country. As Weeratunge (2004) has cited, the number of titles published in the country during the 5 year period from 1998 to 2002 were 11,161, 2,122 and 4,087 titles in Sinhala, Tamil and English languages respectively. According to the statistics published by the NLDC, there are 7,516 libraries in the country out of which 5,448 and 1,133 are school and public libraries respectively (NLDC, 2011) These statistics will help us to imagine the number of times each library has devoted in preparing bibliographic entries. Further, the bibliographic services and tools provided by these libraries may vary from a mere shelf arrangement without any form of catalogue to the use of latest editions of AACR, DDC, LCSH, Sears List etc. and provision of web opacs etc. However a vast majority of libraries may not be in a position to organize such services in the desired level of standard due to scarcity of resources including professional librarians. Even if all libraries are sufficiently equipped with trained manpower and other resources, duplication of classification / cataloguing / indexing work drain the number of professional librarians to technical services functions. If a main portion of the burden of preparing bibliographic services could be relieved, a reasonable number of professionals could be released to occupy positions relating to reader services and assistance. If a centralized system could provide bibliographic records concerning the local publications to libraries, it would eliminate a major part in duplication of work.

(f) Value of the accrued savings through reduction of technical staff in libraries etc. could be estimated and made known to higher authorities, thus improving the bargaining power of the NLDSB / NLDC.

Therefore, the provision of bibliographic services to libraries is an important function which could be handled by the NLDC. At the same time, future bibliographical services directions also have to be identified and necessary adjustments have to be incorporated without disruption of continuity of such services already in operation.

The whole process of generation, delivery and retrieval of information has assumed the proportion of a great ocean. Therefore, all these suggestions essentially need an effective dialogue between all stake holders. Therefore, it is the responsibility of all stakeholders to actively involve in this endeavor to ensure future prosperity of the National Library.

### *References*

ACRL Research Planning and Review Committee, (2012), *2012 top ten* trends in academic libraries: A review of the trends and issues affecting academic libraries in higher education. http://crln.acrl.org/content/73/6/311.full Accessed 03.11.2014

Amarasiri,M. S. U. (1990 a), *Editors note.* In: Amarasiri, M. S. U. (Ed. ). National Library of Sri lanka : commemorative volume, Sri Lanka National Library Services Board, Colombo, 19-31.

Amarasiri,M. S. U. (1990 b), The National Library of Sri Lanka: an introduction. In: Amarasiri, M. S. U. (Ed. ). National Library of Sri Lanka : commemorative volume, Sri Lanka National Library Services Board, Colombo, 54-62.

Amarasiri,M. S. U. (2000), The first decade of the National Library of Sri Lanka. Library News: special volume to commemorate 10th anniversary of the National Library and Documentation Center, 21(1), i-vi

International Coalition of Library Consortia (ICOLC). http://www.icolc.net Accessed 03.11.2014

Library of Congress. (2008), On the record : Report of the Library of Congress Working Group on the Future of Bibliographic Control. http://www.loc.gov/bibliographic-future/news/lcwg-ontherecord-jan08-final.pdf. Accessed 03.11.2014

NLDC, (200?), The National Library and Documentation Services Board of Sri Lanka. (A brochure)

NLDC, (2011), Statistical handbook on libraries in Sri Lanka. NLDC, Colombo.

NLDC, (2014), National Library Network http://www.natlib.lk/index.php/about-us/facts-at-a-glance/national-library-network-natnet Accessed 03.11.2014

NLDC, (2014), National Library of Sri Lanka: [homepage of the NLDC website] http://www.natlib.lk . Accessed 14.12.2014

Ranasinghe, Piyadasa, (2006), National Bibliography: History, sources and problems. In: Ranasinghe, Piyadasa, (Ed.).Vidyarthi: Annual of the Alumni Association of the Department of Library and Information Science, University of Kelaniya. 27-66. (Text in Sinhala).

Ranasinghe, Piyadasa, (2013), Jathika sanwardanaye la jathika pusthakalaye dayakathwaya= Contribution of the National Library in national development: Commemorative lecture delivered on the occasion of the 23rd anniversary of the National Library and Documentation Centre. NLDC, Colombo.

Shafique, Farzana, (2007), Librarianship: how is the future perceived by librarians in Pakistan? . Library Review, 56 (9) : 811-820. http://dx.doi.org/10.1108/00242530710831266 Accessed 03.11.2014

Siriwardene, H. P. (1980), The National Library of Sri Lanka. In: Corea, Ishwari, (Ed.)(1980). Roads to wisdom, Colombo Public Library, Colombo, 87-93

Somadasa, K.D. (1975), The National Library and Documentation Centre of Sri Lanka. In: Corea,Ishvari. (Ed.). Libraries and people, Colombo Public Library, Colombo.

University College London CIBER Research Team, (2008), Report of the CIBER Research Team. http://www.jisc.ac.uk/news/google-generation-is-a-myth-says-new-research-16-jan-2008. Accessed 03.11.2014

Warnasuriya, W.M.A. (1975), The aims and purposes of the Ceylon National Library Services Board. In: Corea,Ishvari. (Ed.). *Libraries and people*, Colombo Public Library, Colombo.

Weeratunge, Jayanthi. (2004), Bibliographic study of book publishing in Sri Lanka: 1998-2002, Sri Lanka Library Review: Journal of the Sri Lanka Library Association, 18: 47-57.

**L.A. Jayatissa**



Graduated from the University of Sri Lanka, Vidyalankara Campus in 1973 with first class honours, Postgraduate Diploma in Library Science and Documentation in 1977 at the University of Kelaniya , Masters Degree in Library and Information Sciences in 1995 at University of Delhi; Librarian of the University of Kelaniya.

ආරම්භයත් සමඟ එය ද බිහි වී ඇති බව සිතිය හැකි ය. ඒ අනුව එහි විකාශනය ක්‍රමයෙන් සිදු වී මෑත කාලය වනවිට සර්ව වර්ගීකරණයේ සිට සූක්ෂම වර්ගීකරණය (Macro Classification to Micro Classification) දක්වා විහිදී ඇති බව පෙනේ. පුස්තකාල ක්ෂේත්‍රයේ දී වඩාත් වැදගත් වන්නේ පුස්තකාලවල දැනුම වර්ගීකරණය පිළිබඳ ව යි. එය 17 හා 18 වන සියවස්වල සිට ම සාකච්ඡාවට ලක් වී ඇති පර්යේෂණ හා අධ්‍යයන කර පොත්පත් පවා රචනා කොට තිබෙන මාතෘකාවකි. මේ අනුව වර්ගීකරණය යන්න Harrod's Librarian's Glosary and Reference Book හි මෙසේ දැක්වේ.

''පුස්තකාලයකට අනුව වර්ගීකරණය යනු පොත්පත් අනෙකුත් සමානතාවෙන් යුත් තොරතුරු ආශ්‍රිත මූලාශ්‍ර ද්‍රව්‍ය තර්කානුකූල අනුපිළිවෙළකට එහි සමානකමේ ප්‍රමාණයට අනුකූලව සකස් කිරීම විශේෂයෙන් මෙහි දී නියමිත කොටස නියමිත තැන ස්ථානගත කිරීමේ ක්‍රමවේදය වර්ගීකරණය'' ලෙස අදහස් කර ඇති බවයි.

## වර්ගීකරණයේ ඉතිහාසය

ලෝකයේ පුස්තකාල වර්ගීකරණ ක්‍රම පුස්තකාල තරම් ම පැරණි වෙයි. ඒ අනුව ලොව ඉතාම පැරණි පුස්තකාලය වන ඇලෙක්සැන්ඩ්‍රියානු පුස්තකාලයේ ද කිසියම් වූ පිළිගත හැකි ක්‍රමවේදයකට අනුව පොත් වර්ග කර තිබූ බවට සාධක තිබේ. විශේෂයෙන් ම 15 හා 16 වන ශත වර්ෂවල දී ද ග්‍රන්ථ විද්‍යාත්මක වර්ගීකරණයන්හි ගැබ් විය යුතු මූලික ලක්ෂණ එම යුගයේ තිබූ වර්ගීකරණ ක්‍රමවල පැවති බව ගම්‍ය වෙති. මෙහි දී ප්‍රථම ග්‍රන්ථ විද්‍යාත්මක වර්ගීකරණය ලෙස හඳුනාගෙන ඇති Konrad Von Gesner (1516-1565) විසින් සකස් කරන ලද Bibliotheca Univeralis යන සූචියේ සංඛ්‍යාලේඛන පිළියෙල කර තිබූ විෂයානුබද්ධ ක්‍රමවේදය විද්‍යාත්මක වර්ගීකරණයක එක් පොදු ලක්ෂණයක් ය. මීට අමතර ව නොයෙකුත් දාර්ශනික පදනම් මත ගොඩනැගුණු වර්ගීකරණ ක්‍රම එකල පුස්තකාලවල භාවිත වූ බවට තොරතුරු හමු වී තිබේ. එසේ ම ඉතිහාසයේ මුල් ම ඥාන වර්ගීකරණ ක්‍රමය ලෙසට ඉන්දියානු සමාජය තුළ ව්‍යාප්ත ව පැවති වේද ශාස්ත්‍රය හඳුන්වා දිය හැකි යි. මෙහි දී විශ්වඥානය **ධර්ම**, **අර්ථ**, **කාම** හා **මෝක්ෂ** වශයෙන් ප්‍රධාන කොටස් 04 කට බෙදා දක්වා තිබේ. ක්‍රි. පූ. 850 දී පමණ යුප්‍රටීස් - ටයිග්‍රීස් ශිෂ්ටාචාරයේ දී පැවති බවට සොයාගෙන ඇති

(Natale Battizzati) විසින් සම්පාදනය කරන ලද වෙළඳ ග්‍රන්ථ නාමාවලිය ද ඒ ඒ විෂයයන් සඳහා වර්ණ පත්‍රිකා භාවිත කරමින් කිසියම් වර්ග ක්‍රමයක් අනුගමනය කළ බවට තොරතුරු වාර්තා වේ.

මෙම පසුබිම යටතේ 19 වන ශත වර්ෂය පමණ වන විට යහපත් ග්‍රන්ථ විද්‍යාත්මක වර්ගීකරණයක් බිහිවීමේ මූලික පදනම ගොඩනැගී ඇති බව පෙනේ. මේ පිළිබඳ පර්යේෂණ හා අධ්‍යයන කළ කිහිපදෙනෙක් ම සිටිය හ. ඒ අතරින් ප්‍රධානත්වයක් ගෙන ඇත්තේ ''ඩිවි'' ලෙස වර්තමානයේ හඳුන්වන **මෙල්විල් ලුවිස් කෝසුත් ඩිවි** මහතා ය. වර්ෂ 1873 දී පමණ ඔහු විසින් කරන ලද ගවේෂණයක තොරතුරු අළලා 1920 දී Library Journal XLV Feb. (151-152p) සඟරාවට Decimal Classification begining යනුවෙන් ලිපියක් ලියා ඇති අතර එහි මෙසේ දැක්වේ.

''මම පුස්තකාල 50 කට අධික සංඛ්‍යාවක් නැරඹුවෙමි. එම පුස්තකාලවල ග්‍රන්ථ නැවත නැවත වර්ග කිරීමේ දී වැය කරන මුදලත්, කාලයත්, දක්වන උදාසීනත්වයත් ගැන මවිතයට පත්වීමි. පොත්පත් රාක්ක ගත කරන ලද්දේ කාමර අංක හෝ රාක්ක අංක අනුව එදිනෙදා පුස්තකාලයට ලැබෙන ආකාරයට යි. මේ සඳහා සුදුසු ක්‍රමයක් ගැන මම දිවා රෑ වෙහෙසුනෙමි. හැකිතාක් දුරට සරල ව ගොඩනගා ගත හැකි වර්ගීකරණ ක්‍රමයක් සෙවීම මාගේ මූලික අභිප්‍රාය විය. මාගේ අදහස වූයේ සැමදෙනා පිළිගන්නා ABC අක්ෂර ක්‍රමයට වඩා 1,2,3 යන අංක ක්‍රමය ඉතා සරල බව යි. මෙම සිතුවිලි දාමයේ පැටලෙමින් මාස ගණනාවක් කල්පනා කළෙමි. එහෙත් එක් ඉරිදා දිනයක ඇම්හර්ස්ට් දේව මන්දිරයේ (AmherstChapel ) ස්ටන්ස් (Sterns) දේවගැතිතුමාගේ දේශනයකට සහභාගි වෙමින් සිටියෙමි. මම මෙම මූලික ගැටලුව ම ගැන කල්පනා කරමින් සිටි නිසා එතුමාගේ දේශනයේ වචනයකුදු ඇහුම්කන් නො දුන්නෙමි. එවිට මට හදිසියේ විසඳුමක් හමුවීය.'' එය අරාබි ඉලක්කම් භාවිතයත් දශම ක්‍රමයත් අනුසාරයෙන් ඔහුගේ වර්ගීකරණ ක්‍රමය බිහිවීම ය. මෙම වර්ගීකරණයේ ද මූලික ම සිද්ධාන්ත ලෙස ගෙන ඇත්තේ බේකන්ගේ හා හැරිස්ගේ දර්ශනයන් ය. ප්‍රැන්සිස් බේකන්ගේ උපකල්පනය සංකල්පනය හා තර්කනය යන මිනිසාගේ ක්‍රියාවන් පදනම් කොට එම අවදියේ පැවති විශ්වඥානය **ඉතිහාසය, කාව්‍ය ශාස්ත්‍රය හා දර්ශනය** යනුවෙන් මූලික කොටස් 03 කට බෙදා දක්වා තිබේ.

මේ ආකාරයෙන් පුස්තකාල ක්ෂේත්‍රයේ දැනුම වර්ගීකරණයේ ඉතිහාසයට පදනම වැටී ඇති අතර එහි විකාශනය කාලයෙන් කාලයට විවිධ වෙනස්වීම්වලට ලක් වී ඇත. මෙහි පරිණාමයේ දී වඩාත් වැදගත් වර්ගීකරණ ක්‍රම බවට පහත සඳහන් වර්ගීකරණ ක්‍රම පත් වී තිබේ.

1. Dewey Decimal Classification - 1876 by Melwil Dewey
2. Expansive Classification - 1873 by C.A. Cutter
3. Universal Decimal Classification - 1899 Edited by Paul Otlett and Henry La Fontain.
4. Library of Congress Classification - 1901
5. Subject Classification 1906 by J.D. Brown
6. Colon Classification - 1933 by S.R. Ranganathan
7. Bibliographic Classification - 1935 by H.E. Bliss

## ඩිවි දශම වර්ගීකරණය - (Dewey Decimal Classification)

පෙර සඳහන් කර ඇති පරිදි මෙල්විල් ඩිවි මහතා ඇමෙරිකාවේ ඇම්හර්ස්ට් විද්‍යාලයේ පුස්තකාල සේවයේ නියුක්ත ව සිටිය දී එවකට ප්‍රකටව තිබූ අරාබි ඉලක්කම් ක්‍රමය උපයෝගි කරගෙන දශම තිත හා සාපේක්ෂ අනුක්‍රමණිකාව ආධාර කොට ඩිවි දශම වර්ගීකරණ ක්‍රමය 1873 දී ප්‍රථම වරට ලොවට හෙළි කර තිබේ. මෙය 1876 වසරේ දී කුඩා පොතක් වශයෙන් ප්‍රකාශයට පත් වී ඇති අතර වසර 100 කට පමණ අධික කාලයක් තුළ විවිධ සංස්කරණවලට භාජනය වෙමින් ලෝකයේ විවිධ රටවල විවිධ පුස්තකාල හා විඥාපන සේවා පවත්වන ආයතනවල තවමත් ජනප්‍රිය ම වර්ගීකරණ ක්‍රමය බවට පත්ව තිබේ. මෙය ඇන්ග්ලෝ ඇමරිකානු රටවල පමණක් නොව අප්‍රිකානු හා ආසියානු කලාපයේ පවත්නා ශ්‍රී ලංකාව, ඉන්දියාව වැනි රටවල පවා බහුල ව භාවිත කරන ප්‍රමිත වර්ගීකරණ ක්‍රමයක් ලෙස දැනට ලොව රටවල් 135 ක පමණ පුස්තකාලවල භාවිත කෙරෙන අතර මෙම වර්ගීකරණ ක්‍රමය විවිධ භාෂාවන් 30 ක පමණ පරිවර්තනයන් ද සුලබ ව දැකිය හැකි යි. (තිලකබන්දු, 1986, පි. 25-75) ඇමෙරිකා එක්සත් ජනපදයේ පමණක් 95% ක පමණ මහජන හා පාසල් පුස්තකාලවල ද 25% ක පමණ විශ්වවිද්‍යාල පුස්තකාලවල ද 20% ක් පමණ විශේෂ පුස්තකාලවල ද ඩිවි වර්ගීකරණයේ නවතම සංස්කරණ භාවිත වුවත් 1985 න් පමණ පසු

## ඩිවි වර්ගීකරණයේ නවතම ලක්ෂණ

1. චක්‍ර හා උපලේඛනවල දී සටහන් උදාහරණ හා සාරාංශ භාවිත කිරීම වඩාත් පුළුල් කිරීම
2. අංක 780 යටතේ සංගීතය සඳහා සම්පූර්ණ සංශෝධිත උපලේඛනයක් ඉදිරිපත් කිරීම.
3. ඇතැම් ක්ෂේත්‍රයන් සඳහා ප්‍රමාණවත් සංශෝධන ඉදිරිපත් කිරීම.
4. සාපේක්ෂ අනුක්‍රමණිකාව වඩාත් අර්ථවත් වූ භාවිතයට පහසු වන සේ ප්‍රමාණයෙන් කුඩා වීම.
5. 1982 දී වෙන ම ප්‍රකාශයට පත්කරන ලද ඩිවි දශම වර්ගීකරණයේ භාවිතය පිළිබඳ අත්පොත 4 වන කාණ්ඩයේ අනුක්‍රමණිකාව සමඟ ඉදිරිපත් කිරීම.
6. ඥාති විෂයයන් අතර සම්බන්ධතාව වඩාත් පැහැදිලි කිරීම සඳහා ''බලන්න'' ''ද බලන්න'' (see, see also) විමර්ශන උපයෝගි කරගෙන තිබීම.
7. සාරාංශ මගින් පන්තිවල බුද්ධිමය හා අංකමය ව්‍යුහය පිළිබඳ පූර්ණ අවබෝධයක් ඇති කිරීමට උත්සහ ගෙන තිබීම.
8. පළමුවන කාණ්ඩයෙහි කැපිටල් T අක්ෂරය සමඟ 1-7 දක්වා සඳහන් චක්‍ර දැක්වීම, ඒ අනුව

T1 - ප්‍රමිත උප බෙදීම්

T2 - භූගෝලීය ප්‍රදේශ, ඓතිහාසික යුග පුද්ගලයන්

T3 - විශේෂ සාහිත්‍ය රූපක සඳහා සාහිත්‍ය උප බෙදීම්

T3 - A තනි කර්තෘ හෝ තනි කර්තෘවරුන් පිළිබඳ කෘති සම්බන්ධ උප බෙදීම්

T3 - B එක් කර්තෘවරයෙකුට වඩා වැඩි අයගේ කෘති හෝ ඔවුන් පිළිබඳ කෘති සම්බන්ධ උප බෙදීම්

T3 - C අංක 03 චක්‍රයෙන් සහ අංක 808 - 809 හි දී ඇති උපදෙස් අනුව එකතු කළයුතු අංකයන් දක්වා තිබීම.

T4 - භාෂා උප බෙදීම්

T5 - වාර්ගික, ගෝත්‍රික හා ජාතික උප බෙදීම්

T6 - භාෂා බෙදීම්

T7 - පුද්ගල කණ්ඩායම් බෙදීම්

ආදි වශයෙන් මෙම වර්ගීකරණ ක්‍රමය දශම අනුපිළිවෙලකට අනුව පොත් රාක්කවල ලේබල් කිරීමේ ක්‍රමවේදයක් වන අතර සමහර විෂයයන් සඳහා සංඛ්‍යාලේඛන ද භාවිත කර ඇති බව දැකිය හැකි ය.

| | | |
|---|---|---|
| උදා : | F 83 - | US history |
| | G 83 - | US Travel |
| | JU 83 - | US Politics |
| | WP 83 - | US Painting |

